# මව්කිරිදීම ප්‍රවර්ධනය කිරීම ආරක්ෂා කිරීම

# සහ

# අනුබලදීම සහ නම්කළ නිෂ්පාදන

# අලෙවිකිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය

## (සංශෝධිත රීති සංග්‍රහය - 2002)


පෝෂණ සම්බන්ධීකරණ අංශය

සෞඛ්‍ය, ආරක්ෂණ,පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

2004

# මව්කිරිදීම ප්‍රවර්ධනය කිරීම ආරක්ෂා කිරීම

# සහ

# අනුබලදීම සහ නම්කළ නිෂ්පාදන

# අලෙවිකිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය

## (සංශෝධිත රීති සංග්‍රහය - 2002)

පෝෂණ සම්බන්ධීකරණ අංශය
සෞඛ්‍ය, ආරක්ෂණ,පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
2004

## පටුන


පිටු අංකය

පෙරවදන iii

ස්තුතිය v

පසුබිම I

සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස
සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය 5

මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ අනුබල දීම සහ
තම්කළ නිෂ්පාදන අලෙවිකිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය 7
(සංශෝධිත රීති සංග්‍රහය)

ඇමුණුම :

(අ) තාක්ෂණ කමිටුවේ සාමාජික නාමලේඛනය 32

(ආ) තාක්ෂණ කමිටුව විසින් පරිශීලනය කරන ලද ලේඛණ 34

(ඇ) I - 1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ
පනත (6) 1 (ඇ) වගන්තිය යටතේ සාමාන්‍ය විධානය 36
(විධාන අංක 44)

(ඇ) II - 1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ
පනත (6) 1වගන්තිය යටතේ පොදු විධානය (විධාන අංක 107) 37

(ඉ) මාතෘ නිවාස, රෝහල්, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමය සහ සෞඛ්‍ය කාර්ය
මණ්ඩලය වෙත ළදරු කිරි පිටි සහ අනෙකුත් මව්කිරි ආදේශක, කිරි
පොවන බෝතල් හෝ සූප්පු නොමිලේ සහ අඩු මිලට බෙදා හැරීම
අත්හිටුවීම
පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ළදරු කිරිපිටි, මව්කිරි ආදේශක
නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් සහ අනෙකුත් අදාල පාර්ශවයන් විසින්
අත්සන් කරන ලද ගිවිසුම

# පෙරවදන

මව්කිරි ප්‍රවර්ධනය සහ ආරක්ෂාව සහ මව්කිරි ආදේශක සහ ආශ්‍රිත නිෂ්පාදන අධීක්ෂණය පිළිබඳවූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය, ඒ පිළිබඳ වූ ජාත්‍යන්තර රීති සංග්‍රහය අනුව යමින් පිළියෙල කරන ලද අතර, ඒ සඳහා 1981 සැප්තැම්බර් මස දී කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිණ.

ඒ අනුව රීති සංග්‍රහයෙහි අන්තර්ගත අලෙවිකරණය සහ ප්‍රචාරක කටයුතු හා බැඳි විධිවිධානයන්, පාරිභෝගික ආරක්ෂක පනත යටතේ ගැසට් කරනු ලැබීමෙන් පසුව, මව්කිරි ප්‍රවර්ධනය හා ළදරු ආහාර ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණය සහ ප්‍රචාරක කටයුතු පාලනය කිරීම සම්බන්ධිතව ප්‍රධාන නීතිමය රැකවරණය ලෙස සළකනු ලැබිය.

රීති පද්ධතියෙහි සඳහන් විධිවිධානයන් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම් එවකට පැවති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ වූ ආහාර හා පෝෂණ ප්‍රතිපත්ති අංශය වෙත පැවරිණි. ඉහත සඳහන් අධීක්ෂණ කටයුතු සිදුකරන ලද්දේ රීති සංග්‍රහයෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධිත රේඛීය ආයතනවල සහයෝගයෙනි. ත්‍රෛමාසිකව පැවති තාක්ෂණ කමිටු රැස්වීම් පදනම් කොට අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක විය.

ඉහත සඳහන් පරිදි අධීක්ෂණ කටයුතු කරගෙන යන අතරතුරදී පෙනීගිය එක් කරුණක් වූයේ කාලීනව පවත්නා තත්වයන් සහ අවශ්‍යතාවයන්ට උචිත පරිදි රීති සංග්‍රහය යාවත්කාලීන කිරීමේ ඇති අවශ්‍යතාවයයි. ඒ අනුව යාවත්කාලීන කළ යුතු කරුණු සම්බන්ධයෙන් 1999 සිටම ළදරු ආහාර නිෂ්පාදකයන් සහ අදාල වෘත්තික සංවිධානවල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් තාක්ෂණ කමිටු රැස්වීම් වාර ගණනාවක්ම පවත්වන්නට යෙදුනි. මෙම අප්‍රතිහත උත්සාහයේ අවසන් ප්‍රතිඵලය වූයේ සංශෝධිත රීති සංග්‍රහයයි. මෙම සංශෝධිත රීති සංග්‍රහය නීතිපතිවරයා විසින් අනුමත කිරීමෙන් පසුව, කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව , 2002 අගෝස්තු මස 14 දින අදාල අනුමැතිය ලබාදෙන ලදී.

නීතිමය ආවරණය ලැබිය යුතුව ඇති රීති සංග්‍රහයෙහි අදාල වගන්තින්ට, එම ආවරණය ලබාදෙනු වස් අදාල එම වගන්තින් අභ්‍යන්තර වෙළදාම පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. මෙපරිදි අභ්‍යන්තර වෙළද කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් ආදල එම නීතිමය

ආවරණය ලබා දෙනු ලබන අතර, රීති සංග්‍රහයෙහි සඳහන් අනෙක් ආචාර ධර්මයන් පිළිබඳ වූ වගන්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමට සෞඛ්‍ය, ආහාර සහ අලෙවි කටයුතු, අධිකරණ, කම්කරු, කර්මාන්ත, අධ්‍යාපන, විද්‍යාත්මක සහ තාක්ෂණ යන අමාත්‍යාංශයන්ද, රාජ්‍ය නොවන සංවිධානයන්ද බැඳී සිටී. මීට අමතරව, අදාල නිෂ්පාදනයන්හි නිෂ්පාදකයන් හා බෙදාහරින්නන්ද රීති සංග්‍රහයෙහි සඳහන් විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල පියවරයන් ගනු ඇත. රීති සංග්‍රහය සම්බන්ධයෙන් වූ අදාල ආයතන අතර සම්බන්ධතාවය සහ අධීක්ෂණ කටයුතු සෞඛ්‍ය, ආරක්ෂණ පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශයේ පෝෂණ සම්බන්ධීකරණ අංශය මගින් සිදු කරනු ඇත.

මෙරට ළදරුවන්ගේ නිසි පෝෂණය සහ පෝෂණයෙහිලා මව්කිරිවල ඇති වැදගත්කම යන සිද්ධාන්තයෙහි පිහිටා, මව්කිරි ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සහ ළදරු පිටිකිරි සහ ආශ්‍රිත නිෂ්පාදනයන් අධීක්ෂණය පිළිබඳ වූ සංශෝධිත ශ්‍රී ලංකා රීති සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ වූ කාර්යයට දායක වීමට ලැබීම සම්බන්ධයෙන් මම මහත් සතුටට පත්වෙමි. මෙම රීති සංග්‍රහය එහි ඉංග්‍රීසි මුල් පිටපතට අමතරව, මේ සඳහා ශ්‍රී ලංකාව තුළ පුළුල් ප්‍රචාරයක් ලබාදීම සඳහා සිංහල සහ දෙමළ භාෂා වලින්ද ලබාගැනීමට හැකිය.

ආර්. මලිගස්පේ
*ලේකම්*
*සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ*
*ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය*



## ස්තූතිය

මෙම සංශෝධිත රීති සංග්‍රහය යාවත්කාලීන කිරීමේ කර්තව්‍යයෙහිදී ඉමහත් කැපවීමකින් යුතුව ක්‍රියාකල මව්කිරි රීති සංග්‍රහය තාක්ෂණ කමිටුවේ සාමාජිකයින්ටත් (ඇමුණුම "අ" බලන්න) මෙහිලා විවිධ අදහස්/ යෝජනාවලින්, සහයෝගය දැක්වූ වෘත්තීය සංවිධාන වලට සහ ළදරු කිරි නිෂ්පාදන සමාගම්වල නියෝජිතයන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.

මෙම රීති සංග්‍රහය යාවත්කාලීන කිරීමේ කටයුතු අංග සම්පූර්ණ කර ගැනීම සඳහා විවිධ අයුරින් සහයෝගය දැක්වූ හිටපු වතු සහ නාගරික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂිකා වෛද්‍ය එස්. මාණිකරාජා මහත්මියටත්, අතිරේක නීති කෙටුම්පත් සම්පාදක එම්. එස්. වික්‍රමසිංහ මහත්මියට සහ අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර කොමසාරිස්, ටී. බී. දසනායක මහතාටත් මාගේ හෘදයාංගම ස්තූතිය හිමිවේ.

මෙහිලා නන් අයුරින් සහයෝගය දැක්වූ යුනිසෙෆ් ආයතනයේ වෛද්‍ය අබේරා බෙකලේ, වෛද්‍ය හිරන්ති විජේමාන්න, ඩී. පී. අදිකාරි සහ වෛද්‍ය සපුමල් ධනපාල මහත්ම මහත්මීන්ද ස්තූති පූර්වකව සිහිපත් කරමි.

මෙම රීති සංග්‍රහය මෙබඳු ප්‍රකාශනයක් වශයෙන් එළිදැක්වීම සඳහා මූලික වී අඛණ්ඩව සහයෝගය පලකරනු ලැබූ පෝෂණ සම්බන්ධීකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ එන්. ඩී. විල්ප්‍රඩ් මහතාටද මාගේ හෘදයාංගම ස්තූතිය හිමිවේ.

අවසාන වශයෙන් සිංහල සහ ඉංග්‍රීසි සෝදුපත් කියවීමෙන් සහාය දැක්වූ එම්. ආර්. ජේ. යූ. ආර් සිල්වා මෙනවියටත් (සංවර්ධන නිලධාරිනි) දෙමළ සෝදුපත් කියවීමෙන් සහාය දැක්වූ සුබෝදිනි ජනකාන් මහත්මියටත් (සංවර්ධන නිලධාරිනි) මාගේ කෘතඥතාවය හිමිවේ.

එන්. සුමනරත්න
*අධ්‍යක්ෂ*
*පෝෂණ සම්බන්ධීකරණ අංශය*

# පසුබිම

බෝතල්වලින් කිරි දීම මෙන් නොව මව්කිරි දීමෙන් ළදරු පෝෂණය කෙරෙහි පැහැදිලි වාසි අත්වන බවද, ආසාදනයට සහ අසාත්මික ආබාධ වලින් ළදරුවා ආරක්ෂා කරන බවද විද්‍යාත්මක සාක්ෂි වලින්, විශේෂයෙන් අන්තිම දශක දෙකේදී, ඉතා හොඳින් පෙන්වා දී ඇත. එයින් ස්වාභාවිකව උපත් අතර පරතරයක් ඇතිවීමද සිදුවෙයි. මව්කිරි වල අත්‍යාවශ්‍ය පෝෂක නිවැරදි අනුපාත වලට ද නිවැරදි උෂ්ණත්වයේ ද අඩංගු වන අතර මාස 4 සිට 6 දක්වා ළදරුවකුට අවශ්‍ය සියළුම පෝෂණය එයින් සැළසේ. ඉන්පසු උචිත පරිපූරක සමග මව්කිරි ළදරුවන්ගේ සහ යටත් පිරිසෙයින් කුඩා දරුවන්ගේ සෞඛ්‍යය සහ සුග සිද්ධිය සඳහා ඉතා වැදගත් වෙයි.

ළදරුවාගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය වැඩි දියුණු වන තෙක් ආසාදන මර්ධන ගුණාංග වලින් යුක්ත මව්කිරි ළදරුවා ආසාදනයන්ගෙන් ආරක්ෂා කරන්නා වූ බැවින් මව්කිරි අසමසම වෙයි. මව්කිරිවල මේ ආසාදන විරෝධි ගුණය මෙන්ම අසාත්මිකතා විරෝධි ලක්ෂණ වෙනත් යම් කෘත්‍රිම ළදරු කිරි මගින් ප්‍රතියෝජනය කළ නොහැකිය. තවද මව්කිරි දීම නිසා මව සහ දරුවා අතර ඇතිවන මනෝවිද්‍යාත්මක බැඳීමේ යහපත බෝතල් වලින් කිරිදීම මගින් කිසි දිනක සැළසිය නොහැකිය.

දුර්වල ළදරු කිරිදීමේ ක්‍රම සහ ඒවායේ ප්‍රතිවිපාක නිසා ප්‍රධාන ගෝලීය ප්‍රශ්නයක් ඇතිවන අතර එය සමාජ සහ ආර්ථික සංවර්ධනයට බරපතල බාධකයකි. මෙය බොහෝ දුරට මිනිසා විසින් ම ඇති කරගත් ප්‍රශ්නයක් නිසා එය විද්‍යාව හා තාක්ෂණයේ අපගේ ජයග්‍රහණ වලට ද අවලාදයක් වන අතර අපගේ සමාජ සහ ආර්ථික ව්‍යුහවල පසුබෑමක් ද වශයෙන් සැළකිය යුතු අතර එය අපගේ ඊනියා සංවර්ධන ජයග්‍රහණ වලට කැළලක්ද වන්නේ ය. එය අප වැනි සංවර්ධනය වන රටවල ප්‍රශ්නයක් පමණක් නොවන්නා වූ අතර එය සංවර්ධිත ලෝකයේ ද බොහෝ කොටස්වලට බලපාන්නේ ය.

පසුගිය දශක කිපය තුළ කෙසේ වුවද දරුවන්ට මව්කිරි දීමේ සම්ප්‍රදායික සිරිත් ක්‍රම ක්‍රමයෙන් පිරිහීමක් ඇතිවී ඇති අතර එබැවින් මව්කිරි සඳහා ආදේශකයක් වශයෙන් ළදරු කිරිපිටි මත වැඩි වැඩියෙන් විශ්වාසය තැබීමක් සිදුවී ඇත්තේය. මව්කිරි දීම අඩුවීම සඳහා ප්‍රධාන හේතු වී ඇත්තේ නාගරීකරණය, ශ්‍රම වෙළඳපොලේ ස්ත්‍රීන්ගේ නව භූමිකාව, මව්කිරි දීම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සහ අධ්‍යාපනය මගින් මවට මග පෙන්වීමක් නොමැතිවීම සහ කිරි ආහාර කර්මාන්තයේ වෙළඳ දැන්වීම් උපක්‍රම මගින් සිදුකරන නොමග යැවීමය.

සාම්ප්‍රදායික වශයෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල ස්ත්‍රීහු ඔවුන්ගේ ළදරුවන්ට මව්කිරි දෙති. එනමුත් මෑත කාලවලදී විශේෂයෙන් නාගරික කාන්තාවන් අතර මව් කිරි දීමේ සිරිතේ ක්‍රමානුකූල අඩුවීමක් සිදුවී ඇත්තේය. කොළඹ නගරයේ නගරබද නොවන්නාවූ ප්‍රදේශයක තනිකර මව්කිරි දීමේ කාලය පිළිබඳ අධ්‍යනයක දී බෝතලයෙන් කිරිදීම හඳුන්වාදීම ඉක්මනින් සිදුවන බව හෙළිදරව් වී ඇත. මෙය වඩාත් කැපී පෙනුනේ රැකියාවල යෙදී සිටින්නාවූ කාන්තාවන් අතර ය. රැකියාවේ යෙදීමට අමතරව මව්කිරි දීමේ හැකියාව පිළිබඳව විශ්වාසය නොමැතිවීම තවත් ප්‍රධාන බලපෑමක් බැව් අධ්‍යයනයෙන් සනාථ වේ.

සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ රටවල සමාජීය ආර්ථික පසුබිම අනුව බැලූ කල මව්කිරි දීමේ ආර්ථික වටිනාකම පරම වැදගත්කමක් ගන්නේ ය. පවුලේ ආදායමින් විශාල ප්‍රතිශතයක් ළදරු ආහාර සඳහා වැය වන බව ශ්‍රී ලංකාව ඇතුළුව විවිධ රටවල දෙමසක් වයසැති ළදරුවෙකුගේ සම්පූර්ණ කිරි පිටි ආහාර දීමේ වියදම පිළිබඳව කරන ලද ජාත්‍යන්තර අධ්‍යයනයකින් හෙළි විය. දෙමසක් වයසැති ගණයට අයත් වූ ළදරුවන්ට සතුටුදායක ලෙස කිරි දීම සඳහා මව්කිරි ආදේශක සැපයීමෙහිලා ශ්‍රී ලංකාවේ ඇතැම් ස්ථිර ආදායම් ලබන්නන්ගේ වැටුපෙන් 43% සිට 63% දක්වා ප්‍රමාණයක් වියදම් වන බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. මෙයට සන්සන්දනාත්මකව ළදරුවාට ප්‍රමාණවත් ලෙස මව්කිරි දීම සඳහා කිරිදෙන මවට අවශ්‍ය අතිරේක ආහාර ලබාදීම සඳහා වියදම ඉතා අඩු ය.



දුප්පත්කම සමග එක්වූ නොදැනුවත්කම නිසා මව්වරුන් විසින් ප්‍රමාණවත් නොවූ සාන්ද්‍රණයක ළදරු කිරි ආහාර භාවිතා කිරීම සිදු වී ඇත. මීට අතිරේකව අපිරිසිදු ජල ප්‍රභව, උණු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන ඉන්ධන සහ බෝතල් සහ සූප්පු වල සීමිත සැපයුම් නිසා ළදරුවන් අතර ආසාදන අවදානම වැඩිවේ. මේ අනුව ආසාදනවල සහ මන්දපෝෂණයේ අවදානම ඇතිව බෝතල්වලින් කිරි පෙවීම නිසා අඩු ආදායම් ලබන්නා වූ පවුල්වල ළදරුවන්ගේ සෞඛ්‍ය කෙරෙහි බරපතල ප්‍රතිඵල ඇතිවේ. බෝතල්වලින් කිරිපෙවීමේ ක්‍රියාවලිය තුළදී ඇතිවුවා වූ නුසුදුසු පුරුදු මගින් ඇති වන්නා වූ රෝගයන්ට සංවර්ධනය වෙමින් පවතින රටවල ළදරුවන් මිලියන 10ක් පමණ වාර්ෂිකව ගොදුරු වන බව ගණන් බලා ඇත. එමනිසා මව්කිරිදීමට අසමත්වීම ළදරු මන්දපෝෂණයට සහ මරණ වලට ප්‍රධාන හේතුවක් වශයෙන් හඳුනා ගෙන ඇත.

මව්කිරි වෙනුවට වූ ආදේශක අලෙවිය පිළිබඳ ජාත්‍යන්තර රීති සංග්‍රහයේ විධි විධානද මව්කිරි වෙනුවට වූ ආදේශක ප්‍රවර්ධනය කිරීම සහ විකිණීම සඳහා පිහිටුවා ගනු ලබන පරිචයන්ට එරෙහිව අදාළ සම්මුතිද මේ රීති සංග්‍රහයට ඇතුළත් වේ. පහත දැක්වෙන මූලධර්ම සම්බන්ධයෙන් සළකා බලනු ලැබ ඇත:

1. යම් නම් කල නිෂ්පාදකයන්ගේ ප්‍රවර්ධනය මව්කිරි දීම අධෛර්යමත් කරන්නේ හෝ මව්කිරි දීම ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීමට සහ රට අනුබල දීමට අයුතු ලෙස මැදිහත් වන්නේ නම් ද එම නම් කළ නිෂ්පාදිත වලට රීති සංග්‍රහය අදාළ විය යුත්තේය.

2. මේ නම් කළ නිෂ්පාදන :

(අ) සිල්ලර මට්ටමේ දී හෝ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් තුලින් හෝ ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කිරීම මගින් හෝ මහජනයා අතර ප්‍රවර්ධනය කිරීම නොකළ යුත්තේ ය.

(ආ) මව්කිරි දීම ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය සහ රට අනුබල දීම සිදුවන පරිදි ලේබලයක් දැරිය යුත්තේ ය.

3. සෞඛ්‍ය ආරක්ෂක සේවකයන් සමග "සමාගම් සම්බන්ධය" ප්‍රවර්ධක නොවන තොරතුරු බෙදා ගැනීමට සීමාවිය යුතු අතර සෞඛ්‍යාරක්ෂක සේවකයන් නම් කළ නිෂ්පාදන මහජනයා අතර ප්‍රවර්ධනය කිරීමේ මාර්ගයක් වශයෙන් භාවිතා නොකළ යුත්තේ ය.

4. ළදරුවන්ට සහ කුඩා ළමයින්ට ආහාර දීම පිළිබඳ තොරතුරු මගින් කිසිම ආකාරයකින් මව් කිරි දීම අධෛර්යමත් කිරීම හෝ පීඩාවට පැමිණවීම හෝ නම් කළ නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම හෝ සිදු නොකළ යුත්තේය.

5. මව් කිරි සමග කිසි දිනක තරග කළ හැකි මොනයම් හෝ ආහාරයක් නොමැති වුවද එහි පෝෂණ සංකීර්ණතාවල ආශ්චර්ය වැඩි වැඩියෙන් අප විසින් සොයා ගන්නා විට අප නිරන්තරයෙන් දුර්වලම ආදේශකයක් වන්නා වූ ළදරු ආහාර හා ඇති තරගයට විරුද්ධව කටයුතු කල යුතු වන්නේ ය. මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීමට අපගේ සමාජය විසින් ඉටු කරන සේවය ඉතා අල්ප හෙයින් බොහෝ ළදරුවන් හට මව්කිරි දීමේ අසම සම ප්‍රතිලාභ නොලැබීම කණගාටුවට කරුණකි.

මහජන සහාය සමග වූ රජයේ කැපවීම රීති සංග්‍රහය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබිය යුත්තේය. විනාශකාරි අලෙවි කිරීමේ උපක්‍රම පිටු දැකීම සඳහා සහ මව්කිරි දීම ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ රට සහාය දීම සඳහා රීති සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුත්තේ ය.



## සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

### මව්කිරිදීම ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ අනුබල දීම සහ නම් කළ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය

ළමා අයිතිවාසිකම් පිළිබඳ වූ ප්‍රඥප්තිය මගින්, මව්කිරිදීම නිසා විශේෂයෙන් ළමයින්ට සහ දෙමව්පියනට ඇතිවන ඵල ප්‍රයෝජන සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත. ළදරු පෝෂණය සහ පූර්ව ළමාවිය සංවර්ධනයෙහිලා මව්කිරි වලට සමාන වෙනත් දෙයක් නොමැත.

මව්කිරි ආදේශක අලෙවිකරණය සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර රීති සංග්‍රහය සහ එය පදනම් කොට පිළියෙල කරන ලද ශ්‍රී ලංකා රීති සංග්‍රහය සම්මත කර ගැනීමෙහිලා හේතු වුයේ මන්ද පෝෂණය, ලෙඩ රෝග සහ ළදරු මරණ සංඛ්‍යාව වැඩි කිරීමෙහිලා තුඩු දුන් විෂම සහ අවිධිමත් ලෙසින් කරගෙන යනු ලබන මව්කිරි ආදේශක අලෙවිකරණයයි.

ඉහතින් දැක්වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරන ලදුව, එහි සඳහන් අලෙවිකරණය සම්බන්ධයෙන් වූ විධිවිධානයන් 1983 පෙබරවාරි මස 08 දිනැති අංක 231/6 දරණ ගැසට් නිවේදනය මගින් නීති ගත කොට ඇත.

පැවතියාවූ යම් යම් නෛතිකමය දුර්වල අවස්ථාවන් උපයෝගි කොට ගෙන පසුගිය වකවානුව තුල රීති සංග්‍රහයෙහි සඳහන් විධිවිධාන දිගින් දිගටම උල්ලංඝණය කරනු ලැබිය. එබැවින් ඉහතින් දැක්වූ නෛතික දුර්වලතාවයන් ඉවත් කොට රීති සංග්‍රහය කාලානුරූපව යාවත් කාලීන කිරීමේ කටයුතු 1999 වසරේ දී ආරම්භ කරන්නට යෙදුනි.

ඒ අනුව පසුගිය වකවානුව තුල පැවති විවිධ සාකච්ඡා වාර සහ අර්ථ පැහැදිලි කර ගැනීම සඳහා වූ සැසිවාරයන් පැවැත්වීමේ අවසන් ප්‍රතිඵලය ලෙස, නීති කෙටුම්පත් වරයා විසින් සම්මත කරන ලද සංශෝධිත රීති සංග්‍රහය සැළකේ.

මෙකී සංශෝධිත රීති සංග්‍රහය කෘත්‍රිම ළදරු ආහාර අලෙවිකරණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරක කටයුතු මැනවින් පාලනය කිරීමෙහිලා නව පදනමක් සහ සංශෝධිත නිතිමය රාමුවක් වනු ඇත. මෙපරිද්දි රීති සංග්‍රහය සවිමත් කිරීම ළදරු පෝෂණයෙහිලා ඉමහත් ප්‍රතිඵලයක් අත්කර ගැනීමට හේතු වනු ඇත. ශ්‍රී ලංකාව විසින් ද අත්සන් තබන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ වූ ප්‍රඥප්තියේ 23 වැනි වගන්තියෙහි සඳහන් පරිදි ළමා පරපුරෙහි අභිවෘද්ධිය පතා මව්කිරිදීම ආරක්ෂා කිරීම ඉතා වැදගත් කාර්යයක් වනු ඇත.

මව්කිරි පිළිබඳව ළදරුවන්ට ඇති උතුම් අයිතිය සහතික කරනු වස් මෙම සංශෝධිත රීති සංග්‍රහය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. රීති සංග්‍රහයේ සඳහන් විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමෙහිලා අදාල සියළුම ආයතනයන්ගෙන් ලැබෙන සහයෝගය මෙහිලා ඉතා අගය කොට සළකමි.

නිමල් සිරිපාල ද සිල්වා
සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ
ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍ය



# මව්කිරි දීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ අනුබල දීම සහ නම්කළ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ වූ ශ්‍රී ලංකා රීති සංග්‍රහය

ශ්‍රී ලංකා ආණ්ඩුව

සෞඛ්‍යය ළඟාකර ගැනීමේ සහ පවත්වා ගැනීමේ මාර්ගයන් වශයෙන් ප්‍රමාණවත් ලෙස පෝෂණය වීමට සෑම ළමයෙකුට සහ සෑම ගර්භනී සහ කිරිදෙන්නාවූ ස්ත්‍රියකට ඇති අයිතිවාසිකම ස්ථිර කරමින්;

ළදරු මන්දපෝෂණය, දිළිඳුකම, පෝෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්කමක් නොමැතිවීම සහ සමාජ දුෂ්කරතාව යන පුළුල් ප්‍රශ්නයන්ගේ කොටසක් බව හඳුනා ගනිමින්;

ළදරුවන්ගේ සහ කුඩා ළමයින්ගේ සෞඛ්‍යය, ස්ත්‍රීන්ගේ සෞඛ්‍යයෙන් සහ පෝෂණයෙන් ද ඔවුන්ගේ සමාජයීය ආර්ථික තත්වයෙන් සහ මව්වරුන් වශයෙන් ඔවුන්ගේ කාර්ය භාරයෙන් ද වෙන් කොට සලකා ගත නොහැකි බව හඳුනා ගනිමින් ද;

මව්කිරි දීම ළදරුවන්ගේ සහ කුඩා ළමයින්ගේ සෞඛ්‍යමය වර්ධනයට පරමාදර්ශී ආහාරය සැපයීමේ අසමසම ක්‍රමය බව ද, මව්කිරි වල ආසාධන විරෝධී ගති ලක්ෂණ ළදරුවන් රෝග වලින් ආරක්ෂා කිරීම, මවගේ සහ ළදරුවාගේ සෞඛ්‍යයට සහ සාමාන්‍ය සුභ සිද්ධියට වාසිදායක වන බව ද මව්කිරි දීම ළමයින් බිහිකරගැනීමේ කාල අතර මව්කිරි දීම වැදගත් සම්බන්ධතාවයක් තිබෙන බවද සහ මව්කිරි දීමට කෘත්‍රිම ආහාර දීමට වඩා අඩු වියදමක් යන බවද සිහිතබා ගනිමින්;

මව්කිරිදීම දෛර්මත් කිරීම ළදරුවන්ගේ සහ කුඩා ළමයින්ගේ වැඩීම සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සෞඛ්‍ය, පෝෂණ සහ වෙනත් සමාජ පියවරවල වැදගත් කොටසක් බව හඳුනා ගනිමින්;

මව්වරුන් මව්කිරි නොදෙන්නා වූ විට හෝ අර්ධ වශයෙන් පමණක් කිරි දෙන්නාවූ විට කෘත්‍රිම ළදරු කිරිපිටි සඳහා නීත්‍යානුකූල වෙළඳපලක් ඇති වන බවද මේවා ඔවුනට ලබාගත හැකි තත්ත්වයක් ඇති කළයුතු නමුදු ඒවා මව්කිරි දීම ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනයට අයුතු ලෙස බලපාන ක්‍රමවලින් අලෙවි කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු බව සළකමින්;

නුසුදුසු ආහාර දීමේ සිරිත් මගින් ළදරු ඌණ පෝෂණයට සහ මරණ වලට හේතු විය හැකි බව ද නම්කළ නිෂ්පාදිත අලෙවි කිරීමේ අනිසි පුරුදු මගින් ප්‍රධාන මහජන සෞඛ්‍ය ප්‍රශ්න වලට රුකුල් දිය හැකි බවද වැඩි දුරටත් හඳුනා ගනිමින් ;

ළදරුවන්ට සාමාන්‍යයෙන් ඔවුන් වයස මාස 4 සිට 6 දක්වා වනවිට උචිත පරිපූරක ආහාර ලැබීම වැදගත් බවද දේශීය වශයෙන් ලබාගත හැකි ආහාර භාවිතා කිරීමට සෑම උත්සාහයක් දැරිය යුතු බවද ඒත්තු ගෙන;

මව්කිරි දීම ධෛර්යමත් කිරීමේදී සහ පහසු කිරීමේදී සහ මව්කිරි දීමේ උසස් වටිනාකම පිළිබඳව මව්වරුන්ට සහ පවුලේ අයට විෂය මූලික සහ නිරන්තර උපදෙස් දීමේ කාර්යයේදී සහ කාර්මික වශයෙන් නිෂ්පාදනය කරනු ලැබුවද නිවසේ දී පිළියෙල කරනු ලැබුවද පරිපූරක ආහාර අවශ්‍ය වූ විට ඒවා උචිත පරිදි භාවිතා කිරීම පිළිබඳ උපදෙස් දීමේදීත් සෞඛ්‍ය සේවා වලට, සෞඛ්‍ය වෘත්තිකයන්ට සහ අනෙකුත් සෞඛ්‍ය රක්ෂණ සේවකයන්ට වැදගත් කාර්යභාරයක් ඇති බව ස්ථිර කරමින්;

උචිත පවුල් සහ සමාජ සහාය සැපයීමෙන් මව්කිරි දීම පහසු කිරීමට සහ ධෛර්යමත් කිරීමට අවශ්‍යතාවයක් ඇති බව පිළිගනිමින්;

මව්කිරි දීම ප්‍රවර්ධනයේ දී සහ මව් කිරි දෙන මව්වරුන්ට අවශ්‍ය සහාය ලැබෙන බව සහතික කිරීමේදී පවුල්වලට, ප්‍රජාවන්වලට, කාන්තා සංවිධානවලට සහ වෙනත් රජයේ නොවන සංවිධාන වලට ඉටු කිරීමට විශේෂ කාර්ය භාරයක් ඇති බව පිළි ගනිමින්;

මාතෘ, ළදරු සහ කුඩා දරුවන්ගේ සෞඛ්‍ය සහ පෝෂණය දියුණු කිරීමේ අරමුණු ඇත්තාවූ ක්‍රියාකාරකම් වලදී සහයෝගය දැක්වී...



නොයෙකුත් සම්බන්ධ විෂයවල විශේෂඥයන්ගේ පාරිභෝගික කණ්ඩායම්වල සහ කර්මාන්තයේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා ආණ්ඩුවට ඇති බව ස්ථිර කරමින්;

එමනිසා,

මේ රීති සංග්‍රහයේ අරමුණ වන්නේ මව්කිරි දීම ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ රට සහාය දීම මගින් ළදරුවන් සහ කුඩා ළමයින් සඳහා ආරක්ෂක සහ ප්‍රමාණවත් පෝෂණය සැපයීම සඳහා දායකවීමෙන් සහ ළදරු කිරිපිටි අවශ්‍ය වන විට ප්‍රමාණවත් තොරතුරු සැපයීමේ පදනම මත සහ උචිත පරිදි වූ අලෙවි කිරීම සහ බෙදා හැරීම මගින් නිසි භාවිතය සහතික කිරීමෙන්;

මේ රීති සංග්‍රහයේ විධිවිධාන මව්කිරි දීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය වීම සඳහා ද නම් කළ නිෂ්පාදිත අලෙවි කිරීම සම්බන්ධයෙන් ද අදාළ රීති සංග්‍රහයෙන් නම් කළ නිෂ්පාදිතවල තත්ත්වය සහ ඒවා ලබාගත හැකි බව සහ ඒවා පරිභෝජනය කිරීම සහ භාවිතය පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන්ද විධිවිධාන දැක්වේ.

පහත දැක්වෙන ව්‍යවස්ථා ක්‍රියාමාර්ග සඳහා පදනම වේ:-

## I වන ව්‍යවස්ථාව - මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම

1.1 සියලුම සෞඛ්‍ය ආරක්ෂක සේවකයන් සහ මාධ්‍යවේදීන් පොදු මහජනතාව අතර මව්කිරි දීමේ වාසි පිළිබඳ දැනුවත් කමක් ඇති කළ යුත්තේ ය.

1.2 සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමය මගින් පහත සඳහන් දේ සඳහා විධිවිධාන සැලැස්විය යුත්තේ ය.
ස්ත්‍රියක් ගර්භනීව සිටින කාලසීමාව තුළ එම ස්ත්‍රියගේ මනා පෝෂණ තත්ත්වය සහතික කිරීම සඳහා සෑම උත්සාහයක්ම දැරිය යුත්තේ ය. ඇය ඒ ඒ තත්ව වලට ගැලපෙන පරිදි මව්කිරි දීමේ වාසි ගැන තොරතුරු ඇයට සැපයිය යුත්තේ ය. එම තොරතුරු ඇයගේ අවබෝධය සහ ඒවා පිළිගැනීම වර්ධනය වන ආකාරයකට ප්‍රායෝගික ක්‍රමයකින් ඉදිරිපත් කළ යුත්තේ ය.

තමන්ගේ විශේෂ සමාජමය, ආර්ථික හෝ සෞඛ්‍ය තත්ත්වයන් නිසා මව්කිරි නොදීමේ වැඩි අවදානමක් තිබිය හැකි මව්වරුන් සහ කලින් යම් ගර්භනී භාවයකදී මව්කිරි දීමට අපොහොසත් වී ඇති අය සම්බන්ධයෙන් සැලකිල්ල දැක්වි යුත්තේ ය.

ප්‍රසූතිය වේලාවේ දී භාවිතා කරන ප්‍රසව විද්‍යා කායික පරිපාටි මව්කිරිදීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූල විය යුත්තේය. අනවශ්‍ය නිදිගැන්වීම් සහ කිරිවැරීම මර්ධනය කරන බෙහෙත් පාවිච්චියෙන් වැලකිය යුත්තේ ය.

ළදරුවගේ උපතින් මිනිත්තු තිහක් ඇතුලත මව්කිරි දීම ආරම්භ කළ යුත්තේ ය. මව්කිරිදීම පහසුකිරීම සඳහා මව්වරුන්ට තමන්ගේ ළදරුවන් තමා වෙත තබා ගැනීමට සහ මාස හයක් යනතුරු "ඉල්ලූවිට කිරිදීමේ ක්‍රමය" භාවිතා කිරීම සඳහා ධෛර්යමත් කළ යුත්තේ ය.

සියළු සෞඛ්‍යය ආරක්ෂක ක්‍රමවලදී සහ මාධ්‍ය මගින් ළදරුවාගේ සහාය මවට දැක්වීමේදී ස්වාමිපුරුෂයාගේ, මවගේ, නැන්දම්මාගේ සහ ව්‍යාප්ත වූ පවුලේ අනිකුත් සාමාජිකයයන්ගේ කාර්ය භාරය අවධාරණය කළයුත්තේය.

ප්‍රසූතියෙන් පසු වහාම සෑම ළදරුවකුටම කොලොස්ට්‍රම් ලැබිය යුතුය. උපරිම මව්කිරිදීම සඳහා පරිපූරක බෝතල් කිරිදීම, ජලය, කොත්තමල්ලි වතුර, ග්ලූකෝස් වතුර, කෘත්‍රිම ළදරු කිරි, රත කල්ක හෝ වෙනත් යම් ද්‍රව දීමෙන් වැළකිය යුත්තේය. ප්‍රමාණවත් ආහාර මවට ලබාගත හැකි බවට පත් කිරීමෙන් මවගේ පෝෂණ තත්ත්වය සහතික කළ යුත්තේය. උපත් අතර පරතරයක් සහතික කිරීමට ඇති අතිරේක පියවර ප්‍රවර්ධනය කරන අතර තනිකර මව්කිරි දීමේ ඇති උපත් පාලන බලපෑම හොඳින් හඳුනා ගත යුත්තේය. මව්කිරි දීම කෙරෙහි බාධා ඇති නොකරන ක්‍රම සඳහා ප්‍රමුඛත්වය දිය යුත්තේ ය.

1.3 සියළු මව්වරුන්ට ජීවත්වන පළමු දරුවන් දෙදෙනා වෙනුවෙන් සති දොළහකට නොඅඩු වැටුප් සහිත ප්‍රසූත නිවාඩු දිය යුතු අතර රැකියාවේ සුරක්ෂිතභාවය ආර්ථික වශයෙන් සහාය දිය යුත්තේය.



1.4 මව්කිරිදීම ප්‍රවර්ධනය කිරීම සඳහා සේවායෝජකයින් විසින් දිවා සුරැකුම් ස්ථාන, පාරිශ්‍රමිකයන් අහිමි වීමකින් තොරව අතරින්පතර මව්කිරි දීමේ කෙටි නිවාඩු සහ වෙනත් පහසුකම් සැපයිය යුත්තේය.

1.5 ප්‍රජාවගේ සහ ආණ්ඩුවේ සහාය සියළු ආකාරයේ සන්නිවේදන මාධ්‍ය, ආගමික සංවිධාන සහ අනිකුත් සහ ලියාපදිංචි ස්වේච්ඡා සමාජයීය සංවිධාන මව්කිරිදීම ධෛර්යමත් කිරීමේහිලා සක්‍රිය ලෙස සම්බන්ධ විය යුත්තේ ය.

## II වන ව්‍යවස්ථාව - මහජනතාව අතර අලෙවිකිරීම සහ ප්‍රවර්ධනය කිරීම

2.1 කිසිම තැනැත්තකු විසින් යම් නම් කළ නිෂ්පාදනයක් ළදරු ආහාර සඳහා උචිත නිෂ්පාදනයක් බවට ප්‍රචාරය කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුත්තේ ය.

2.2 කිසිම නම් කළ නිෂ්පාදනයක් එම නිෂ්පාදනය ළදරුවකුට දුන් විට මව්කිරිදීමට සමාන හෝ ඒ සමග සංසන්දනය කළහැකි බව හෝ ඊට වඩා උසස් බවට වූ විශ්වාසයක් හෝ ඇඟවීමක් ඇති කරන ආකාරයට අලවි කිරීම හෝ ප්‍රසිද්ධියේ එසේ සඳහන් කිරීම නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් නොකළ යුත්තේ ය.

2.3 භාජනයේ හෝ ඊට අලවා ඇති ලේබලය පහත සඳහන් විස්තර වලට අනුකූල වන්නේ නම් මිස, නම් කළ නිෂ්පාදකයකු හෝ බෙදා හරින්නකු එවැනි නිෂ්පාදනයක් විකිණීමට ඉදිරිපත් කිරීම හෝ විකිණීම නොකළ යුත්තේය.

(අ) "වැදගත් දැන්වීමයි" යන වචන අඩංගු විය යුත්තේය.

(ආ) මව් කිරි දීමේ උසස්තම පිළිබඳව ප්‍රකාශය අඩංගු විය යුතුය. "මව්කිරි දීමේ පෝෂණ ලක්ෂණ වලට අතිරේකව මව්කිරි දීමෙන් බොහෝ රෝග වලින් ආරක්ෂාව සැපයේ. එමනිසා කාර්මික වශයෙන් පිළියෙල කරන ලද පිටිකිරි, මනා වෛද්‍ය උපදෙස් මත මිස, මව්කිරි වෙනුවට යොදා නොගත යුත්තේය."

(ඇ) "මව්කිරි ආදේශකය" මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු පරිදි සකස් කරන ලදී, "ප්‍රවිකරණය කරන ලදී," හෝ ඊට සමාන යෙදුම් භාවිතා නොකළ යුත්තේ ය.

(ඈ) මව්කිරි දීම අභිබවා යාම සඳහා කිරීමට ඉඩ ඇති පද මාලාවක් භාවිතා නොකළ යුත්තේ ය.

(ඉ) කිරි පිළියෙල කිරීමේ තොරතුරු ප්‍රකාශ කෙරෙන කිරි දීමේ යටගනක් සහ පිළියෙල කර ගත් ඉතිරි වූ කිරි පිටි ඉවත දැමිය යුතු බවට ප්‍රකාශන ඇතුලත් විය යුත්තේ ය.

(ඊ) (අ), (ආ), (ඇ), සහ (ඈ) වන ඡේදවල සඳහන් කාරණා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් දැක්විය යුත්තේ ය. විකිණීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නිෂ්පාදිතය මව්කිරිවලට ආදේශකයක් වන බවට, වැරදි හැඟීමක් ඇති කිරීමට සැලසුම් කරන ලද ඡායාරූප, චිත්‍ර හෝ වෙනත් ප්‍රස්ථාරමය නියෝජන හෝ නොමඟ යවන සුළු වාක්‍ය බණ්ඩ භාජනයේ හෝ ඊට අලවා ඇති ලේබලයේ නොතිබිය යුත්තේ ය.

(උ) (අ) සහ (ආ) නියෝජනය වන්නා වූ අකුරු මි. මී. 5ක උස ප්‍රමාණයට අඩු නොවිය යුත්තේ ය.

2.4 ළදරු කිරිපිටි පාවිච්චි කිරීමේ ක්‍රමය පිළිබඳ තොරතුරු 2.3 ඡේදයේ නියමයන්ට අනුකූලව හැර යම් නිෂ්පාදකයකු හෝ බෙදා හරින්නෙකු හෝ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන වෙනත් යම් තැනැත්තකු විසින් මහජනයාට බෙදා නොහැරිය යුත්තේ ය.

2.5 මව්කිරි ආදේශකයක් හෝ පරිපූරක ආහාරයක් වශයෙන් භාවිතා කරන්නා වූ ද, ළදරු ආහාර සඳහා නියම කර ඇති පෝෂණ ප්‍රමිතීන් හා නොගැලපෙන්නා වූද, යම් නිෂ්පාදිත ළදරු ආහාරයක, කිරි හෝ කිරි නිෂ්පාදනයක පහත දැක්වෙන වචන අඩංගු විය යුත්තේය.



"මේ නිෂ්පාදනය ළදරුවන්ගේ ආහාර සඳහා යොදා නො... යුත්තේය."

2.6 කිසිම තැනැත්තකු විසින් යම් පරිපූරක ආහාරයක්, වයස මාස හයට අඩු යම් ළදරුවකු සඳහා උචිත ආහාරයක් ලෙස ප්‍රචාරය කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම නොකළ යුත්තේ ය.

එසේ වුවද අධීක්ෂණ කමිටුවේ අනුමැතිය සහිතව වයස මාස හයේ සිට දොළහ දක්වා වූ ළදරුවන් සඳහා වූ පරිපූරක ආහාර පිළිබඳ ප්‍රචාර කිරීම කළ හැකි ය.

## III වගවස්ථාව - පවුල් සාමාජිකයන් අතර අලෙවිය සහ ප්‍රවර්ධනය

3.1 අලෙවියේ යෙදුන පුද්ගලයින් ඔවුන්ගේ ව්‍යාපාරික තත්ත්වයෙන් ගර්භනී ස්ත්‍රීන්, මව්වරුන් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමග කිසිම සම්බන්ධයක් නොපැවැත්විය යුත්තේ ය.

3.2 නම් කළ නිෂ්පාදිත මිල නොමිලයේ දෙන සාම්පල හෝ සැපයුම් මව්වරුන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට හෝ පොදු ජනතාවට කෙලින්ම හෝ වක්‍රාකාරයකින් ලබාගත නොහැකි විය යුත්තේ ය.

3.3 නම් කළ නිෂ්පාදිත නිෂ්පාදකයෙකු, බෙදා හරින්නෙකු හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් තැනැත්තකු ගර්භනී ස්ත්‍රීන්ට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ පොදු මහජනතාවට ඔවුන්ගෙන් ලැබෙන නිෂ්පාදිතයක් වශයෙන් හඳුනා ගත හැකි නම් කළ නිෂ්පාදිතයක භාවිතය ප්‍රවර්ධනය කරන යම් තෑගි භාණ්ඩ හෝ භාජන බෙදා නොහැරිය යුත්තේ ය.

3.4 ළදරුවකුගේ පෝෂණය වෛද්‍ය උපදෙස් මත ළදරු ... සැකසුම් මගින් සිදු කරන විට එම සැකසුම පිළියෙල ආකාරය සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාකරු විසින් ළදරු මා... පෙන්වා දැක්විය යුත්තේ ය.

3.5 කිසිම් තැනැත්තෙකු ළදරු ආහාර සැකසුම් පිළියෙල කිරීමේ ආකාරය පෙන්වා දීම කණ්ඩායම් මගින් සිදු නොකළ යුත්තේ ය.

## IV වන ව්‍යවස්ථාව - සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති

4.1 සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති මගින් මව්කිරි දීම දෛර්‍යමත් කිරීම, ආරක්ෂා කිරීම සහ එයට සහාය දීම සිදු කළ යුතු අතර මේ රීති සංග්‍රහයේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා රජයේ බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කළ යුත්තේ ය.

4.2 යම් නම් කළ නිෂ්පාදනයක නිෂ්පාදකයෙකු හෝ බෙදා හරින්නෙකු විසින් නම් කළ නිෂ්පාදිත හෝ ලොකු දැන්වීම් ප්‍රදර්ශනය කිරීම හෝ දෙන ලද ද්‍රව්‍ය බෙදා හැරීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතියේ පහසුකම් භාවිතා නොකළ යුත්තේ ය. එවැනි කිසිම පහසුකමක් නම් කළ නිෂ්පාදිත හෝ පරිපූරක ආහාර ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා ද භාවිතා නොකළ යුත්තේ ය.

4.3 යම් නිෂ්පාදකයෙකු හෝ බෙදා හරින්නෙකු විසින් දෙන ලද්දා වූ හෝ වැටුප් ගෙවන ලද්දාවූ "මාතෘ සේවක" ගෙදියක් භාවිතා කිරීම සඳහා යොදා ගැනීමට අවසර නොදිය යුත්තේ ය.

4.4 ගර්භනී ස්ත්‍රියක විසින් හෝ මවක විසින් නොමිළයේ ලද්දා වූ හෝ අඩු මිලට ලද්දා වූ නම් කළ නිෂ්පාදයන්හි සාම්පල කවර අවස්ථාවක දී භාවිතා නොකළ යුත්තේ ය.

4.5 රෝහල්වල, මාතෘ ඒකකවල සහ වෙනත් සෞඛ්‍ය ආරක්ෂක පද්ධතිවල සහ ඒවායේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයම නම් කළ නිෂ්පාදිත හෝ පරිපූරක ආහාර ප්‍රදානය කිරීම්, නොමිළයේ සැපයීම් හෝ තොග මිලට වඩා අඩු මිලකට සැපයීම් සඳහා අවසර නොදිය යුත්තේ ය.



4.6 මාතෘ වාට්ටුවක සහ රෝහල්වල සිටින්නාවූ මව්කිරි ආදේශක අවශ්‍ය වන්නා වූ ළදරුවන් සඳහා අවශ්‍ය මව්කිරි ආදේශක කුඩා ප්‍රමාණයන් සාමාන්‍ය සැපයීමේ මාර්ග මගින් මිස, නිදහස් හෝ සහනාධාර සැපයුම් මගින් නොසැපිය යුත්තේය.

4.7 හදිසි සහන මෙහෙයුම් වලදී ළදරුවක් සඳහා මව්කිරි දීමේ ආරක්ෂාව, ප්‍රවර්ධනය සහ සහාය පවත්වාගත යුතු අතර එම ළදරුවන්ට නම් කළ නිෂ්පාදිත පහත දැක්වෙන කොන්දේසි මත පමණක් ප්‍රදානය කළ යුත්තේ ය:-

(අ) මරණය නිසා හෝ නිශ්චිත තත්ත්වයක් නිසා තමන්ගේ මවගෙන් වෙන්වීම නිසා තමන්ගේ මව නැතිවී ඇති ළදරුවකු සඳහා,

(ආ) ළදරුවාට එය අවශ්‍ය වන තාක්ම දිගටම පවත්වාගෙන යාම

(ඇ) විකුණුම් පෙළඹවීම වශයෙන් සැපයීම භාවිතා නොකිරීම

(ඈ) වෛද්‍ය උපදෙස් අනුව වූ නිර්දේශයක් මත පරිපූර්ණ සඳහා ඉල්ලීම

## V වන ව්‍යවස්ථාව - සෞඛ්‍ය ආරක්ෂණ සේවකයන්

5.1 විද්‍යාත්මක සහ සිද්ධිමය තොරතුරු ඇතුලුව ළදරුවන්ට සහ කුඩා ළමයින්ට ආහාර දීම පිළිබඳව කිසිම තොරතුරක් යම් නිෂ්පාදකයෙකු හෝ බෙදා හරින්නෙකු විසින් සෞඛ්‍ය ආරක්ෂණ සේවකයෙකුට නොදිය යුත්තේ ය:

එසේ වුවද, නිෂ්පාදකයා හෝ බෙදාහරින්නා විසින් එම තොරතුරු සම්බන්ධයෙන් සියලු කරුණු අධීක්ෂණ කමිටුවට හෙළිකරන අවස්ථාවකදී සහ කමිටුව විසින් ඒ තොරතුරු අනුමත කරන අවස්ථාවකදී එසේ අනුමත කරනු ලැබූ එවැනි තොරතුරු, නිෂ්පාදකයා හෝ බෙදා හරින්නා විසින් යම් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයකට හෝ වෘත්තිය සෞඛ්‍ය සංවිධානයකට ලබාදිය හැකිය.

5.2 නම් කළ නිෂ්පාදිත හෝ පරිපූර්ණ ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා කිසිම මූල්‍ය හෝ ද්‍රව්‍යමය පෙළඹවීම් නිෂ්පාදකයා හෝ බෙදාහරින්නා විසින් කෙලින්ම හෝ අන් ආකාරයකින් සෞඛ්‍ය ආරක්ෂණ සේවකයෙකුට හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයෙකුට පිරිනැමීම හෝ දීම නොකළ යුත්තේ ය.

5.3 නම්කළ නිෂ්පාදනවල හෝ පරිපූරක ආහාරවල ඒවා පිළියෙල කිරීම හෝ පාවිච්චි කිරීම සඳහා වූ උපකරණවල හෝ භාජන ආදියෙහි සාම්පල, සෞඛ්‍ය ආරක්ෂණ සේවකයන්ට නොසැපයිය යුත්තේය. සෞඛ්‍ය ආරක්ෂක සේවකයන් විසින් ළදරු ආහාර හෝ පරිපූරක ආහාරවල සාම්පල ගැබිණි මව්වරුන්ට,ළදරුවන්ගේ සහ ලාබාල දරුවන්ගේ මව්වරුන්ට හෝ ඔවුන්ගේ පවුල්වල අයට නොසැපයිය යුත්තේය.

5.4 නම්කළ නිෂ්පාදනයක හෝ පරිපූරක ආහාරයක නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව ඇතුලත හෝ පිටත අධි ශිෂ්‍යත්ව, අධ්‍යයන, ප්‍රදාන සහ රැස්වීම්, සම්මන්ත්‍රණ, අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා හෝ සම්මේලන ආදියට සහභාගි වීම සඳහා අරමුදල් සැපයීම ඇතුළුව එහෙත් රට සීමා නොවන යම් ත්‍යාග හෝ ප්‍රතිලාභ සෞඛ්‍ය ආරක්ෂක සේවකයකුට පිරිනැමීම හෝ දීම නොකළ යුත්තේ ය. යම් නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින්, ව්‍යවස්ථා සංග්‍රහයේ අරමුණුවලට අනුකූල වූ යම් ජාතික වශයෙන් පිළිගත් වෛද්‍ය සංගමයකට දායක විය හැකි අතර එම දායකත්වය, 8.3 ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන කමිටුව වෙත දැනුම් දිය යුත්තේ ය. නම්කළ නිෂ්පාදකයකු හෝ පරිපූරක ආහාරයක නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් ඒ රැස්වීමකදී, සම්මන්ත්‍රණයක දී හෝ අධ්‍යාපන පාඨමාලාවේදී තම නිෂ්පාදනය ප්‍රවර්ධනය කරන ප්‍රචාරක කටයුතු නොකළ යුත්තේ ය.

5.5 සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාකරුවකු විසින්, වෘත්තීය රැස්වීමක්, සම්මේලනයක් හෝ අධිශිෂ්‍යත්වයක් යනාදියනට සහභාගී වීම සඳහා ප්‍රවාහනය, හෝ දරන ලද වියදම් ගෙවීමක්, සහිතව



නිෂ්පාදනයක හෝ පරිපූරක ආහාරයක නිෂ්පාදකයකුගෙන් හෝ බෙදාහරින්නකුගෙන් භාර නොගත යුත්තේ ය.

5.6 නම්කළ නිෂ්පාදනයක් හෝ පරිපූරක ආහාරයක් පිළිබඳව සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාකරුවකු විසින් සිදු කරන පර්යේෂණයක් 8.3 ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුව විසින් අනුමත කර ඇත්නම් මිස, ඒ පර්යේෂණයක් සඳහා කිසි නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් අරමුදල් සපයනු නොලැබිය යුත්තේය. එවැනි නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් සපයන ලද අරමුදලින් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාකරුවකු කළ පර්යේෂණයක ප්‍රතිඵලයක් වශයෙන් කරන පළකිරීමක, අරමුදල්වල ප්‍රභවය හෙළිදරව් කරන ප්‍රකාශයක් ඇතුළත් විය යුත්තේ ය.

5 : 7 නම් කළ නිෂ්පාදනයක් හෝ පරිපූරක ආහාරයක් පිළිබඳ තොරතුරු හෝ ඒවායේ වෙළඳ නම් හෝ සංකේත ලකුණ සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙලවල පාවිච්චියට ගන්නා, (යම් නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකුගේ අනුග්‍රහයෙන් සැපයෙන) රෝග විනිශ්චය කාඩ්පතක රෝග ප්‍රතිශක්තිකරණ කාඩ්පතක දින දර්ශනයක, ඖෂධ නියම කිරීමේ ආකෘතියක හෝ වර්ධන වක්‍ර කඩ්පතක නිරූපණය නොවිය යුත්තේ ය.

## VI වන ව්‍යවස්ථාව - නිෂ්පාදකයන්ගේ හෝ බෙදාහරින්නන්ගේ සේවකයන්

6.1 සේවකයකු අලෙවි කරන නම්කළ නිෂ්පාදනයක හෝ පරිපූරක ආහාරයක ප්‍රමාණය ඔහුගේ පාරිශ්‍රමිකය තීරණය කරන උපමානය නොවිය යුතු ය. අලෙවි ප්‍රමාණය පදනම් කරගෙන කෝටා, ප්‍රසාද මුදල් හෝ රැකියාවේ උසස්වීම් ප්‍රදානය නොකළ යුතු ය.

6.2 නම්කළ නිෂ්පාදන හෝ පරිපූරක ආහාර අලෙවි කිරීමේ සේවයෙහි නියුක්ත කර සිටින තැනැත්තන්, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාකරුවන් ලෙස කටයුතු කිරීම හෝ ගැබිණි කාන්තාවන්, මව්වරුන් හෝ පොදු මහජනයා හා සම්බන්ධ අධ්‍යාපනික කර්තව්‍යයක් ඉටුකිරීම හෝ නිරූපණය කිරීම නොකළ යුතු ය.

## VII වන ව්‍යවස්ථාව - නිෂ්පාදකයන් හෝ බෙදාහරින්නන්

7.1 යම් නිෂ්පාදකයකු විසින් බෙදාහරින්නකුට හෝ යම් බෙදාහරින්නකු විසින් හෝ නම්කළ නිෂ්පාදන හෝ පරිපූරක ආහාර සඳහා කෙටිකාලීන හෝ අඩුමිලට සැපයීමේ උපක්‍රම යොදාගැනීම සඳහා දිරිගැන්වීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම නොකළ යුත්තේ ය.

7.2 යම් නම්කළ නිෂ්පාදනයක හෝ පරිපූරක ආහාරයක නිෂ්පාදක හෝ බෙදාහරින්නා විසින් අලෙවි ස්ථානයේ ප්‍රචාරක කටයුතු හෝ ප්‍රදර්ශනය කිරීම් හෝ සිල්ලර මට්ටමේදී සාම්පල බෙදා හැරීම් සඳහා මුදල් යෙදවීම පහසුකම් සැපයීම හෝ වෙනත් ආකාරයක දිරිගැන්වීම් හෝ නොකළ යුත්තේ ය.

7.3 මේ රීති සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව සියලු නම්කල නිෂ්පාදක හෝ පරිපූරක ආහාරවල නිෂ්පාදකයන් විසින් බෙදා හරින්නන් දැනුවත් කළ යුත්තේ ය.

7.4 ශ්‍රී ලංකාවෙහි නම්කළ නිෂ්පාදනයක හෝ පරිපූරක ආහරයක නිෂ්පාදකයන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු, ළදරුවන් හා ලාබාල ළමුන් සඳහා වන ආහාර සහ වෙනත් ඒ හා සම්බන්ධ නිෂ්පාදනවල දී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නියමකර තිබෙන ප්‍රමිති හෝ තත්ත්වයන්ද සෞඛ්‍යාරක්ෂක රීති සංග්‍රහයන්ද හෝ එවැනි ප්‍රමිතිය නියමිතව නොමැතිනම්, කෝඩෙක්ස් අලිමන්ටාරියස් කොමිෂන් සභාවේ ප්‍රමිති පිළිපැදිය යුත්තේ ය.

7.5 සූප්පු, කිරි පොවන බෝතල්, සහ නැළවුම් භාණ්ඩ හැර නම්කළ නිෂ්පාදනයක හේ පරිපූරක ආහාර ඇසිරීමේ නිරත පොදු හෝ පෞද්ගලික ආයතනද 7.4 ව්‍යවස්ථාවේ සඳහන් තත්ව පාලන ප්‍රමිති හා ක්‍රියාමාර්ග අනුගමනය කළ යුත්තේ ය.



7.6 සියලු නම්කළ නිෂ්පාදන ආනයනය 8.3 ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

7.7 ළදරු ආහාර පෝෂණය හා සම්බන්ධ කිසි අධ්‍යාපනික හෝ තොරතුරු ප්‍රකාශන ද්‍රව්‍යමය කිසිවක් නිෂ්පාදනය කිරීම හෝ බෙදාහැරීම කිසිම නම්කල නිෂ්පාදනයක නිෂ්පාදකයකු හෝ බෙදාහරින්නකු විසින් කරනු නොලැබිය යුත්තේ ය.

7.8 අපේක්ෂිත ප්‍රතිඵල අත්තර ගත හැකිවනු පිණිස මෙම රීති සංග්‍රහයේ විධිවිධාන අනුව ක්‍රියාකරන බවට වගබලා ගැනීමට අවශ්‍ය පියවර, නම්කළ නිෂ්පාදන හෝ පරිපූරක ආහාර නිෂ්පාදකයකු, බෙදාහරින්නකු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ගනු ලැබිය යුත්තේ ය.

## VIII වන ව්‍යවස්ථාව -ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය

8.1 මේ රීති සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්කම කරන බවට වගබලාගැනීම පිණිස, සෞඛ්‍ය, වෙළඳ, ආහාර හා වෙළඳ, අධිකරණ, කම්කරු, කර්මාන්ත, අධ්‍යාපන සහ විද්‍යා හා තාක්ෂණ කටයුතු අමාත්‍යාංශ ද රාජ්‍ය නොවන සංවිධාන සහ නම්කළ නිෂ්පාදන හෝ පරිපුරක ආහාර නිෂ්පාදකයන් හා බෙදාහරින්නන් ද විසින් තනි තනිව හා එක්ව ක්‍රියා කළ යුතුය. රීති සංග්‍රහයේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන්, විෂයභාර අමාත්‍යාංශය ප්‍රධාන වශයෙන් වගකිව යුත්තේ ය.

8.2 නිසි ක්‍රියාමාර්ග ගත හැකි වනු පිණිස, රීති සංග්‍රයේ විධිවිධානවලට අනුකූල ක්‍රියාකාරකම් කෙරෙහි නිෂ්පාදකයන්ගේ, බෙදාහරින්නන් ගේ, සැපයුම්කරුවන්ගේ සහ අනුයෝජිතයන්ගේ අවධානය යොමු කිරීම, රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තිකයන්ගේ සහ වෘත්තීය කණ්ඩායම්වල බැඳීමක් විය යුත්තේය. රීති සංග්‍රහය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන්, අධීක්ෂණ කමිටුව විසින් පත් කරනු ලබන විශේෂඥ කමිටුව විසින් නිසි පියවර ගනු ලැබිය යුත්තේ ය.

8.3 රීති සංග්‍රහයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය සඳහා, විෂය භාර අමාත්‍යවරයා විසින් කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර, මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්ද අමාත්‍යවරයාට උපදෙස් දීම සහ රීති සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධ වාර්තා සමාලෝචනය, ඒ කමිටුව විසින් කරනු ලැබිය යුත්තේ ය.

කමිටුව අවධානයට පත්කරන ලද රීති සංග්‍රහ උල්ලංඝනය කිරීමේ අවස්ථා සම්බන්ධයෙන් කමිටුව විසින් උචිත පියවර ගනු ලැබිය යුත්තේ ය.

8.4 ව්‍යවස්ථා 8.3 යටතේ පත් කරනු ලැබූ කමිටුව අවම වශයෙන් මාස 2 කට වරක් රැස්විය යුත්තේ ය.



## අර්ථකථන

මේ රීති සංග්‍රහයේ කාර්ය සඳහා -

ප්‍රචාරය - යන්නෙන්, නම්කළ නිෂ්පාදන අලෙවිය හෝ පාවිච්චිය හෝ බෙදාහැරීම රූපවාහිනිය මගින්, ගුවන් විදුලිය මගින් චිත්‍රපට විඩියෝ හෝ මුද්‍රණ ද්‍රව්‍යමය දේ මගින් සැලසුම් හෝ වක්‍රව ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා කවර හෝ උපක්‍රමයක් මගින් යම් නිරූපණයක් කිරීම අදහස් වේ.

පරිපූරක ආහාර- යන්නෙන් ළදරුවකුගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමට මව්කිරි හෝ ළදරු ආහාර සැකසුම් ප්‍රමාණවත් නොවන විට දී මව්කිරි වෙනුවට පරිපූරකයක් වශයෙන් සුදුසු හෝ යෝග්‍ය බවට නිරූපණය කරනු ලබන යම් පිරිසැකසුම් කළ හෝ අර්ධ වශයෙන් පිරිසැකසුම් කළ, ආනයනය කළ හෝ දේශීයව නිෂ්පාදිත ආහාරයක් අදහස් වේ.

බහලුම - යන්නෙන් සාමාන්‍ය සිල්ලරට විකිණීම් ඒකකයක් ලෙස නිෂ්පාදන ඇසිරීම සඳහා යොදාගන්නා, එකිමිද ඇතුළුව කවර හෝ ඇසුරුමක් අදහස් වේ.

නම්කළ - නිෂ්පාදනය යන්නෙන් ළදරුවන්ට ආහාර වශයෙන් ප්‍රයෝජනයට ගන්නා හෝ යෝග්‍ය බවට අන්‍යාකාරයෙන් අලෙවි කරන හෝ අන්‍යාකාරයෙන් නිරූපණය කරන

- මව්කිරි ආදේශක
- සෝයා කිරි
- මෝල්ටඩ් මිල්ක්
- උකුකළ කිරි
- ළදරුවන් සඳහා වන පූර්ණ යොදය සහිත කිරිපිටි

මව්කිරි වෙනුවට ආදේශකයන් ලෙස යොදා ගන්නා වෙනත් ළදරු කිරි ආදේශක, සහ වෙනත් යම් නිෂ්පාදන සහ (පරිපූරක ආහාර හැර) කිරි පොවන බෝතල්, සූප්පු, තැළවුම් උපකරණ, තනපුඩු ආවරණ සහ වෙනත් යම් නිෂ්පාදනයක් අදහස් වේ.

බෙදාහරින්නා - යන්නෙන් යම් නම්කළ නිෂ්පාදනයක් තොග වෙළඳ මට්ටමේ හෝ සිල්ලර වෙළඳ මට්ටමේ අලෙවි කිරීමේ ව්‍යාපාරයෙහි (සෘජුවම හෝ වක්‍රව) යෙදී සිටින තැනැත්තෙක්, සංස්ථාවක් හෝ වෙනත් අස්ථිත්වයක් අදහස් වේ. ප්‍රාථමික බෙදාහරින්නා යනු නිෂ්පාදකයකුගේ අනුයෝජිතයා, අලෙවි නියෝජිතයා, ජාතික බෙදාහරින්නා හෝ තැරැව්කරු වේ.

කිරි පොවන බෝතලය යන්නෙන් ළදරුවකුට හෝ ලාබාල දරුවකුට පෙවීමේ කාර්ය සඳහා අලෙවි කරනු ලබන යම් බෝතලයක් හෝ බඳුනක් අදහස් වේ.

සෞඛ්‍ය ආරක්ෂක පද්ධතිය යන්නෙන්, මව්වරුන්ට, ළදරුවන්ට, ගැබිණි කාන්තාවන්ට හෝ කිරිදෙන දාරකාගාරවලට හෝ ළමා සුරැකුම් ආයතන වලට හෝ වෙනත් පිහිටුවන ලද අලෙවිහල් වලට සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීමෙහි සෘජුවම හෝ අන්‍යාකාරයෙන් යෙදී සිටින ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ නොවන වෘත්තිකයන්, පෞද්ගලික ආයතන හෝ සංවිධාන අදහස් වේ.

සෞඛ්‍ය ආරක්ෂක ක්‍රියාකරු යන්නෙන්, ස්වේච්ඡා සේවකයන් සහ ඖෂධ සංයෝජනයෙහි නිරත රසායනඥයන් ඇතුළු, වෘත්තිය හෝ වෘත්තීය නොවන, සෞඛ්‍ය ආරක්ෂක පද්ධතියක සෞඛ්‍ය ආරක්ෂක පද්ධතියක සෞඛ්‍ය ආරක්ෂාව සැපයීමෙහි යෙදී සිටින හෝ සැපයීම සඳහා පුහුණුව ලබන තැනැත්තන් අදහස් වේ.



ළදරුවා - යන්නෙන් මාස දොළහක් දක්වා වයස් වන දරුවෙක් අදහස් වේ.

ළදරු ආහාර-සැකසුම් යන්නෙන් වයස අවුරුද්දක් දක්වා දරුවන්ගේ විධිමත් පෝෂණ අවශ්‍යතා සපුරාලීම පිණිස, මව්කිරි සඳහා ආදේශකයක් ලෙස, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතියට අනුකූලව හෝ එවැනි ප්‍රමිතියක් නොමැතිවිට "කෝඩෙක්ස් අලිමෙන්ටාරියස්" කොමිසමේ ප්‍රමිතියට අනුකූලව කාර්මික වශයෙන් නිෂ්පාදිත සත්ව හෝ ශාක මූලයෙන් යුත් සහ ඔවුන්ගේ කායික විද්‍යාමය ගුණාංගවලට ගැළපෙන පරිදි නිෂ්පාදිත සත්ව හෝ ශාක මූලයෙන් යුත් කිරි නිෂ්පාදිතයක් අදහස් වේ. ළදරු ආහාර සැකසුම් නිවෙසේදී පිළියෙල කරගත හැකි අතර ඒවා "නිවසේදී පිළියෙල" කලදේ විස්තර කරයි.

ලේබලය - යන්නෙන් නම්කළ නිෂ්පාදිතයක් ඇතුළත් බහලුමක ලියා, මුද්‍රණය කර, ස්ටෙන්සිල් මුද්‍රිත, සලකුණු කළ, එබ්බු වූ හෝ කා වැද්ද වූ හෝ අමුණන ලද හෝ අන්‍යාකාරයකින් ඒ මත දැක්වෙන යම් ඇමුණුමක්, ලකුණක්, චිත්‍රයක් හෝ වෙනත් විස්තරාත්මක දෙයක් අදහස් වේ.

නිෂ්පාදක - යන්නෙන් සෘජුවම හෝ අනුයෝජිකයකු හෝ අස්තිත්වයක් මගින් හෝ සිය පාලනය යටතේ පවතින හෝ ගිවිසුමක් යටතේ, යම් නම්කළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයෙහි හෝ කර්තව්‍යයෙහි යෙදී සිටින සංස්ථාවක් හෝ වෙනත් අස්තිත්වයක් අදහස් වේ.

අලෙවිකිරීම - යන්නෙන් නිෂ්පාදන ප්‍රවර්ධනය, බෙදාහැරීම, විකිණීම, ප්‍රචාරය, නිෂ්පාදනය, අදාළ මහජන සම්බන්ධතා සහ තොරතුරු සේවා අදහස් වේ.

අලෙවි සේවක පිරිස - යන්නෙන් මේ රීති සංග්‍රහය තුළට ගැනෙන නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන අලෙවි කිරීම තම කර්තව්‍යයන්ට ඇතුළත්වන යම් තැනැත්තෙක් අදහස් වේ.

මාතෘ ශිල්පිය-හෙදිය යන්නෙන් සුදුසුකම් ලත් හෝ සුදුසුකම් නොලත් හෙදියක වන එහෙත් බෝතලයෙන් පෙවීම හෝ මේ රීති සංග්‍රහයේ විෂය ප්‍රමාණය ඇතුළත් වන ළදරු ආහාර සැකැස්මක් හෝ වෙනත් යම් නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කරන, නිළ ඇඳුමින් යුත්, සමාගම් නියෝජිතයකු වන, ළදරු ආහාර සමාගමක සේවකයකු අදහස් වේ.

තනපුඩු - ආවරණය යන්නෙන් දරුවාට පියයුරෙන් කිරි උරාබීම සඳහා වූ සූප්පුවක් සහිත ආවාරණයක් අදහස් වේ.

තැළවුම් - උපකරණය යන්නෙන් 'ඩමිය' යනුවෙන් ද සඳහන් කරනු ලබන, සහ ළදරුවන්ට සූප්පු කිරීම සඳහා වූ සූප්පුවක් අදහස් වේ.

ප්‍රවර්ධනය- යන්නෙන් නම්කළ නිෂ්පාදනයක් මිලදී ගැනීමට හෝ පාවිච්චි කිරීමට තැනැත්තකු සැපුවම හෝ වක්‍රව දිරිගන්වන උපාය මාර්ගයක් යොදා ගැනීම අදහස් වේ.

සාම්පලය- යන්නෙන් යම් නම්කළ නිෂ්පාදිතයකින් නොමිලේ සපයන තනි කොටසක් හෝ සුළු කොටසක් අදහස් වේ.



සැපයීම- යන්නෙන්, දිළිඳු පවුල් සඳහා සැපයුම් ඇතුළුව, සමාජ සේවා කාර්ය සඳහා නොමිලයේ හෝ අඩු මිලට, යම් ව්‍යාප්ත කාලසීමාවක් තුළ පාවිච්චිය සඳහා සැපයෙන නම්කළ නිෂ්පාදිත හෝ පරිපූරක ආහාරයක ප්‍රමාණයක් අදහස් වේ.

ලාබාල දරුවා- යන්නෙන් මාස දොළහක් සිට අවුරුදු දෙකක වයසක් දක්වා දරුවකු අදහස් වේ.

## රීති සංග්‍රහයේ වර්ධනයේ ඉතිහාසය

මව්කිරි දීමේ බහුවිධවූ වාසි සහ බෝතලයෙන් කිරි දීමේ දුර්විපාක කෙරෙහි අවධානය යොමුවීමට ආරම්භ වූයේ හැත්තෑව දශකයේදිය. මව්කිරි ආදේශක සහ ළදරු ආහාර අලෙවිය පිළිබඳ ජාත්‍යන්තර නීති සංග්‍රහයක වර්ධනයට තුඩු දුන් මව්කිරිදීමේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියෙන් මෙම කාලසීමාව තුළ සිදු වූ ඇතැම් වැදගත් සිදුවීම් මෙහි පහත දැක්වේ.

(I) සමාජ ආර්ථික තත්ත්වයන් ඉතා අසතුටුදායකව තිබෙන සංවර්ධනය වන රටවල මව්කිරි දීමේ වැදගත්කම හුවා දක්වන ප්‍රකාශයක් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක උපදේශක කණ්ඩායම (පීඒජී) විසින් 1972 දී නිකුත් කරන ලදී.

(II) අගහිඟකම්වලට එරෙහි බ්‍රිතාන්‍ය සංවර්ධන ඒජන්සිය විසින් 1974 දී පළකරන ලද "ළදරු මාරයා" නමින් වූ වාර්තාව, තුන්වන ලෝකයේ ළදරු මන්ද පෝෂණය සහ මව්කිරි ආදේශක පිළිබඳ ප්‍රචාර අතර පවත්නා සම්බන්ධතා කෙරෙහි විශ්ව ව්‍යාප්ත අවධානය යොමු කළේය.

(III) 1974 දී පැවති විසිහත්වන ලෝක සෞඛ්‍ය සභා සැසිවාරවලදී, මව්කිරි දීමේ අගය විදහා දැක්වෙන විවිධ නිර්දේශාත්මක ක්‍රියාමාර්ග එළිදක්වන ලදී.

(IV) "මව්කිරිදීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින්, පෙර පාසැල් දරුවාට ආහාර දීම සහ කිරි වරන කාලය" පිළිබඳව ජාත්‍යන්තර ළමාරෝග වෛද්‍ය සංගමය විසින් 1975 දී සංවිධානය කරන ලද විශේෂ සම්මන්ත්‍රණයකදී මව්කිරි දීම වැඩි වැඩියෙන් උනන්දු කරවීමේ පියවර නිර්දේශ කරන ලදී.



(V) 1979 දී ලෝ. සෞ. සං/යුනිසෙෆ් ආයතනය පිහිටුවාගි දී ඒකාබද්ධ රැස්වීමක් කැඳවූ අතර එහි ප්‍රධාන අරමුණ වූයේ මවුකිරි දීම උනන්දු කරවීම සහ බිළිඳු සහ ළමා පෝෂණය වැඩි දියුණු කිරීම ය. මෙම රැස්වීමේදී උද්ගත වූ අතිවැදගත් නිර්දේශය වූයේ ළදරු කිරි ආහාර, පරිපූරක ආහාර, එම ආහාර දීමේදී භාවිතා කරන බෝතල් සහ සූප්පු අලෙවි කිරීමේ කටයුතු පාලනය කිරීමට ජාත්‍යන්තර රීති පද්ධතියක් සම්පාදනය කිරීම ය. එතැන් පටන් ළදරු පෝෂණය කෙරෙහි යොමු වූ අවධානය ඉතා දැඩි විය.

(VI) ජාත්‍යන්තර රීති පද්ධතියක් සම්පාදනය කිරීම හා සම්බන්ධ කටයුතු 1979 දී ආරම්භ වී 1980 ව පුරා අඛණ්ඩව කෙරීගෙන ගියේ ය. මේ පිළිබඳ අවසාන ලේඛනය කෙටුම්පත් කිරීමේ දී ලෝ. සෞ. ස., යුනිසෙෆ්, වෙනත් එක්සත් ජාතීන්ගේ ආයතන, ජාතික ආණ්ඩු, ළමාරෝග වෛද්‍යවරු, පෝෂණ විද්‍යාඥයන්, පාරිභෝගික කණ්ඩායම් සහ ළදරු ආහාර නිෂ්පාදන කර්මාන්තය යන මේ ආයතනවලින් සහ පුද්ගලයන්ගෙන් කරුණු විමසා බලන ලදී.

(VII) 1981 මැයි මාසයේ දී තිස් හතරවන ලෝක සෞඛ්‍ය සභා සැසිවාරයේ දී මවුකිරි ආදේශක අලෙවි කිරීම පිළිබඳ ජාත්‍යන්තර රීති පද්ධතියක් සම්මත කරන ලදී. (රටවල් 118 ක් පක්ෂව ද, එක් රටක් විපක්ෂව ද, ඡන්දය දුන් අතර රටවල් තුනක් ඡන්දය දීමෙන් වැළකී සිටියේය.) මෙම ජාත්‍යන්තර රීති පද්ධතියට පුළුල් සහයෝගයක් ලැබුණු අතර එය ළමා සෞඛ්‍ය සේවා පිළිබඳ ජයග්‍රහණ අතර ඉතා සුවිශේෂ සිද්ධියක් සේ සලකන ලදී. එය මවුකිරි දීමට දැඩි ප්‍රයත්නයක් දැරීමේ කඩිනම් අවශ්‍යතාව කෙරෙහි ලෝකය පුරා බොහෝ රාජ්‍යවල අවධානය යොමු කළේය. දැනට රටවල් 75ක් මෙම ජාත්‍යන්තර රීති පද්ධතියේ නිර්දේශ සමහරක් හෝ සියල්ලම හෝ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේ. නමුත් රීති පද්ධතියේ අඩංගු සෑම විධිවිධානයක් සම්බන්ධයෙන්ම නීති සලසා ඇත්තේ රටවල් 16 ක් පමණි.

(VIII) ලෝ.සෞ.සං/යුනිසෙෆ් ඒකාබද්ධ රැස්වීමට ප්‍රථමයෙන් ශ්‍රී ලංකා රජය මවුකිරි දීම උනන්දු කරවීමට පියවර ගෙන තිබිණි. 1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්‍ෂක කිරීමේ පනත යටතේ නිකුත් කල අංක : 22/7 සහ 1979 පෙබරවාරි මස 07 වැනි දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව සියළුම ළදරු කිරි ආහාරවල "මව්කිරි ඉතා අගනේ යයි වෛද්‍යවරු පවසති." යන පාඨය ප්‍රදර්ශනය කළයුතු බවට විධානය කර ඇත. ළදරු කිරි ආහාර පිළිබඳ සියලුම දැන්වීම් වලද ඒ හා සමාන පණිවුඩයක් අඩංගු විය යුතු යයි තවදුරටත් විධාන කළේ ය.

(IX) "ළදරු කිරි ආහාර කිසිවක් කෙසේ වෙතත් ආකාරයකින් වුවද දෘශ්‍යමාන දැන්වීම් මගින් හෝ ගුවන් විදුලිය මගින් ප්‍රචාරය නොකලයුතුයයි" තහනම් කිරීම ඩුකලි වැඩිවෙමින් පැවති බෝතලයෙන් කිරිදීමේ නැඹුරුව සීමා කිරීමට රජය විසින් ගන්නා ලද තවත් සුවිශේෂ පියවරකි. 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්‍ෂක පනත යටතේ 1980 නොවැම්බර් 10 වැනි දින සහ අංක : 114/2 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් නිකුත් කරන ලද අංක : 24 දරණ විධානය මගින් මෙය ක්‍රියාත්ම කර ඇත.

(X) තාක්‍ෂණික විශේෂඥ කමිටුවක් විසින් සම්පාදනය කරන ලද මවු කිරි දීම උනන්දු කරවීම සහ මවුකිරි ආදේශකත් ඒ ආශ්‍රිත නිෂ්පාදනත් අලෙවි කිරීම පිළිබඳව වූ ශ්‍රී ලංකා රීති පද්ධතිය 1981 සැප්තැම්බර් 17 වැනි දින එවකට සිටි ජනාධිපති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ආමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ශ්‍රී ලංකා රීති පද්ධතිය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා ලදුව ව්‍යවස්ථා සම්පාදනය සඳහා අවශ්‍ය බලය අමාත්‍ය මණ්ඩලය විසින් 1981 සැප්තැම්බරයේ දී පිරිනමන ලදී.



(XI) ශ්‍රී ලංකා රීති පද්ධතියේ ඇතැම් අදාළ ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම සඳහා තාවික කටයුතු හා වෙළඳ අමාත්‍යංශය විසින් පාරිභෝගික ආරක්ෂක පනත යටතේ ව්‍යවස්ථා සම්පාදනය කරන ලදී. රීති පද්ධතිය මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වගකීම දරන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ තාක්ෂණික කමිටුව විසින් එම කෙටුම්පත් ව්‍යවස්ථාව සලකා බලා නිර්දේශ කරන ලදී. ළදරු ආහාර අලෙවි කිරීම සහ ඒ පිළිබඳ දැන්වීම් පළ කිරීම හා සම්බන්ධ අදාළ විධිවිධාන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ 1983 පෙබරවාරි 08 වැනි දින අංක 231/6 දරන ගැසට් නිවේදනය මගින් ගැසට් පත්‍රයේ පළ කරන ලදී. (ඇමුණුම ඇ I බලන්න)

(XII) 1984 දී ජාත්‍යන්තර කිරි ආහාර සමාගමක් වන නෙස්ලේ සමාගම මෙම රීති පද්ධතිය ක්‍රියාත්මක කිරීමට එකඟ විය.

(XIII) 1986 දී ලෝක සෞඛ්‍ය සභාව මාතෘ නිවාසවලට ළදරු කිරිපිටි සංයෝග නොමිලේ හෝ සහන මිලට සැපයීම තහනම් කරන ලෙස නිර්දේශ කළේය.

(XIV) 1989 දී ලෝ. සෞ. සං. සහ යුනිසෙෆ් ආයතනය ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කොට මාතෘ සේවා විසින් මවුකිරි දීම සුරක්ෂිත කිරීම, නගා සිටුවීම, රුකුල්දීම සහ උනන්දු කරවීම නිර්දේශ කළ අතර "ළදරු මිතුරු රෝහල් මූලික සේවාවක් (බී.එෆ්. එච්. අයි) ඇති කිරීම සඳහා පියවර දහයක් ද සකස් කළේය. මවුකිරි ආදේශක ලබාදීමට ඇබ්බැහි වී සිටින රජයේ සහ පෞද්ගලික යන දෙවර්ගයේම රෝහල් එම තත්වයෙන් මුදවා ගැනීමත් මවුකිරි දීම කෙරෙහි ප්‍රසූති සේවාවන් උනන්දු කරවීමත් අරමුණු කරගත් "ළදරු මිතුරු රෝහල් මූලික සේවාව" ලෝ. සෞ. සං සහ යුනිසෙෆ් ආයතනය එක්ව 1991 වර්ෂයේ දී දියත් කරන ලදී.

(XV) 1990 දී ජාත්‍යන්තර නීතියක් බවට පත්වූ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් මවුකිරි දීම සඳහා අවශ්‍ය දැනුම සහ සහාය පවුල්වලට සැපයීමට රටවල් නීතිානුකූලව බැඳී සිටීම තහවුරු කළේ ය. ශ්‍රී ලංකාව 1991 ජූලි මස 12 වැනි දා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය එයට නෛතික තත්වය ලබා දුන්නේ ය.

(XVI) මාස 4 සිට 6 දක්වා කාලයක් හුදෙක් මවුකිරි පමණක් දීමට සියලුම කාන්තාවන්ට හැකිවන අන්දමේ පරිසරයක් නිර්මාණය කරන ලෙසත් 1995 වන විට ජාත්‍යන්තර රීති පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සියලු රටවල් විසින් අවශ්‍ය පියවර ගන්නා ලෙසත් 1990 අවිහිංසකත්ව ප්‍රකාශනය මගින් (ඉනොසෙන්ටි ඩික්ලරේෂන් මගින්) ඉල්ලා ඇත.

(XVII) 1991 දී ලෝක සෞඛ්‍ය සභාව, අවිහිංසකත්ව (ඉනොසෙන්ටි) අරමුණ අනුමත කෙරෙන යෝජනාවක් සම්මත කොට මවුකිරි ආදේශකයන් රෝහල්වලට සහ ප්‍රසූති වාට්ටුවලට නොමිලේ සැපයීම 1993 දෙසැම්බර් මස වන විට නවත්වන ලෙස මවුකිරි ආදේශක නිෂ්පාදනය කරන්නන්ගෙන් හෝ බෙදාහරින්නන්ගෙන් ඉල්ලා සිටියේ ය.

(XVIII) ශ්‍රී ලංකාවෙහි මවු කිරි දීම උනන්දුවෙන් කරවනු පිණිස වැඩකරන මවුවරුන්ට එතෙක් ලබාදුන් සති හයේ පඩි සහිත ප්‍රසූත නිවාඩුව 1992 මාර්තු සති සිට සති 12ක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.

(XIX) ශ්‍රී ලංකාවේ මවුකිරි දීම උනන්දු කරවීමට සහාය වනු පිණිස 1992 ජූලි මාසයේ දී කාර්ය බලකායක් පිහිටුවනු ලැබිය. මෙහි උපරිම අවස්ථාව වූයේ සෞඛ්‍ය අමාත්‍යංශයත්, ළදරු කිරිපිටි සංයෝග හා මවුකිරි ආදේශක නිෂ්පාදනය කරන්නන් හෝ බෙදාහරින්නන් ද වෙනත් අදාළ පාර්ශවයන්ද අතර 1993 ජනවාරි 27 වැනි දින ගිවිසුමක් අත්සන් කොට ළදරු කිරිපිටි සංයෝග, වෙනත් මවුකිරි ආදේශක, කිරි බෝතල් සහ සූප්පු,



ප්‍රසූති ආරෝග්‍යශාලාවලට, රෝහල්වලට වෙනත් සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් සහිත ස්ථානවලට ඒවායේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට නොමිලේ සහ අඩුමිලට සැපයීම නවතා දැමීමය. ('ඉ' ඇමුණුම බලන්න) මෙම ගිවිසුමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ද කමිටුවක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් පත් කරනු ලැබූ අතර එම කමිටුව ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කරයි. එම ගිවිසුමේ විධිවිධාන නව සංශෝධනයට ඇතුළත් කර ඇත.

(XX) දිවයිනේ ප්‍රමුඛතම ප්‍රසූති ආරෝග්‍යශාලාව වන, ද සොයිසා කාන්තා රෝහල "ළදරු මිතුරු රෝහලක්" වශයෙන් ප්‍රකාශයට පත්කොට ළදරු මිතුරු රෝහලේ ආයතන ක්‍රමය 1993 දී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද්දේ යුනිසෙෆ් ආයතනයේ විධායක අධ්‍යක්ෂ අභාවප්‍රාප්ත ජේම්ස් ග්‍රාන්ට් මහතා විසිනි. මේ වන විට ආයතන 75 ක් "ළදරු මිතුරු" ආයතන වශයෙන් ප්‍රකාශයට පත්කර තිබේ. මාතෘ ඒකක "ළදරු මිතුරු" ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය දැනට ව්‍යාප්ත කරමින් පවතී.

ඇමුණුම - අ

## තාක්ෂණ කමිටුවේ සාමාජික නාම ලේඛනය
## (සංශෝධිත රීති සංග්‍රහය - 2002)

1. සී. මාලියද්ද මහතා
   ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය (සභාපති)

2. ආචාර්ය පී. රාමානුජම්
   අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

3. මහාචාර්ය ප්‍රියානි සොයිසා
   ළමාරෝග පිළිබඳ හිටපු විශේෂඥ

4. මහාචාර්ය ටී. ඩබ්. වික්‍රමනායක
   පෝෂණ උපදේශක, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

5. මහාචාර්ය එස්. පී ළමාබදුසූරිය
   ළමා රෝග පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය

6. මහාචාර්ය ඩී. පී. හරේන්ද්‍ර ද සිල්වා
   ළමා රෝග පිළිබඳ මහාචාර්ය, රුහුණු විශ්ව විද්‍යාලය, ගාල්ල

7. මහාචාර්ය නාරද වර්ණසූරිය
   ළමා රෝග පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

8. එම්. එස්. වික්‍රමසිංහ මහත්මිය
   නියෝජ්‍ය නීතිකෙටුම්පත් සම්පාදක, නීතිපති දෙපාර්තමේන්තුව

9. වෛද්‍ය එච්. එම්. එස්. එස්. ඩී. හේරත්
   නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය, පෝෂණ හා සුභ සාධන අමාත්‍යාංශය

10. වෛද්‍ය දුලා ද සිල්වා
    නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, (මහජන සෞඛ්‍ය සේවාII) සෞඛ්‍ය හා පෝෂණ හා සුභ සාධන, අමාත්‍යාංශය



11. අධ්‍යක්ෂ
    පවුල් සෞඛ්‍ය කාර්යාංශය

12. වෛද්‍ය එස්. මාණිකරාජා
    වෛද්‍ය නිළධාරී, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

13. වෛද්‍ය මනෝරි සේනානායක
    ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

14. වෛද්‍ය සී. ඩී. ගුණරත්න
    අධ්‍යක්ෂ, පෝෂණ අංශය, සෞඛ්‍ය, පෝෂණ හා සුභ සාධන අමාත්‍යාංශය

15. ටී. බී. දසනායක මහතා
    සහකාර කොමසාරිස්, අභ්‍යන්තර වෙළඳ කටයුතු දෙපාර්තමේන්තුව

16. සී. ඩී. ආර්. ඒ. ජයවර්ධන මහතා
    අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කොළඹ

17. වෛද්‍ය එච්. විජේමාන්න
    වැඩසටහන් නිළධාරිනී, යුනිසෙෆ්

16. සභාපති
    ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය - කොළඹ

19. සභාපති
    ළමා රෝග විශේෂඥයින්ගේ සංගමය, කොළඹ

20. එන්. සුමතරත්න මහතා
    අධ්‍යක්ෂ, පෝෂණ සම්බන්ධීකරණ අංශය, සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය

21. එන්. ඩී. විල්ප්‍රඩ් මහතා
    සහකාර අධ්‍යක්ෂ, පෝෂණ සම්බන්ධීකරණ අංශය, සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය

ඇමුණුම - ආ

## තාක්ෂණ කමිටුව මගින් පරිශීලනය කරන ලද ලේඛන

1. මව්කිරි ආදේශක අලෙවිකරණය පිළිබඳ ජාත්‍යන්තර නීති පද්ධතියේ කෙටුම්පත, ලෝක සෞඛ්‍ය සංවිධාන ලේඛණය අංක ඒ/33/6 එකතුව -1980 අප්‍රේල් 24

2. ළදරුවන්ට හා කුඩා දරුවන්ට ආහාර- අදාල ජාතික ව්‍යවස්ථාව පිළිබඳ වූ සමීක්ෂණය ආචාර්ය ජේ. ද. මුවර්ලූස්, ලෝක සෞඛ්‍ය සංවිධානය

3. ළදරුවන් සහ කුඩා ළමයින්ට ආහාරදීම පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය / යුනිසෙප් රැස්වීමේ ඉදිරි කටයුතු පිළිබඳ වාර්තාව - ලෝක සෞඛ්‍ය සංවිධාන අධ්‍යක්ෂ ජනරාල් 1980 අප්‍රේල් 03

4. ළදරු ආහාර වට්ටෝරු නිෂ්පාදන පිළිබඳ චර්යා ධර්ම පද්ධතිය - මැලේසියානු සෞඛ්‍ය අමාත්‍යාංශය 1980 ජූලි 01

5. "ලෝක සෞඛ්‍ය සංවිධානය සහ මැලේසියානු ආචාර ධර්ම පද්ධතිය තිබියදීත් ළදරු ආහාර වට්ටෝරු පිළිබඳව අඛණ්ඩව කරගෙන ගිය ප්‍රවර්ධන කටයුතු" පිළිබඳ සංදේශය - සභාපති, පාරිභෝගිකයන්ගේ සංවිධානය, පෙනැංග්, මැලේසියාව

6. ළදරු කිරි ආහාර සඳහා වූ ශ්‍රී ලංකා විශේෂ ප්‍රමිතිකරණ කෙටුම්පත - ලංකා ප්‍රමිති කාර්යාංශය

7. ළදරු කිරි ආහාර පාලනය වන නීති

   ආහාර හා ඖෂධ (අංත 2) 1949 පනත
   ආහාර හා ඖෂධ (අංක 2) 1951 පනත
   ආහාර හා ඖෂධ (අංක 2) 1955 පනත
   ආහාර හා ඖෂධ (අංක 8) 1961 පනත



8. 1979 අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂක පනත - 6 වන කොටස (1) යටතේ පොදු නියෝග (සී) ළදරු කිරි (පිටි) ආහාර විකිණීම

9. අති විශේෂ ගැසට් නිවේදනය - 1979 පෙබරවාරි 7 අංක 22/7 - 1979 අංක 1 පාරිභෝගික ආරක්ෂක පනත 3 සහ 4 නියෝග - 6 (1) කොටස යටතේ (සී) ළදරු කිරි ආහාර දවටන පිළිබඳ අවවාද විශේෂකරණය

10. අති විශේෂ ගැසට් නිවේදනය - 1980 නොවැම්බර් 10 අංක 114/2. 1979 අංක 1 පාරිභෝගික ආරක්ෂක පනත - අංක 24 නියෝගය ළදරු කිරි ආහාර ප්‍රචාරය තහනම් කෙරෙන නියෝග

11. අති විශේෂ ගැසට් නිවේදනය - 1981 මාර්තු 3 - අංක 130/4 1979 අංක 1 පාරිභෝගික ආරක්ෂක පනත - අංක 28 නියෝග - 6 (1) කොටස යටතේ පොදු නියෝග (සී) කිරි ආහාර (පිටි) විකිණීම.

12. ශ්‍රී ලංකාවේ ළදරු කිරි ආහාර නිෂ්පාදන අවස්ථාවේදී එහි තත්ත්වය පිළිබඳව කෙරෙන පරීක්ෂණය - ආචාර්ය ඒ. සී. සුහෙයිබ්, - සතොස තාක්ෂණ වාර්තාව අංක 3 නොවැම්බර් 1980

13. "අවශ්‍ය ප්‍රමාණයට මව්කිරි නොලබන කුඩා බිළිඳුන්ගේ ආහාර වේල් පරිපාලනය" එක්සත් ජාතීන්ගේ පරීක්ෂණ කමිටුවේ පෝෂණය පිළිබඳ සම්බන්ධීකරණ උප කමිටු වාර්තාව. 1979 නොවැම්බර් 5- 7 රෝමයේ පැවති රැස්වීමෙන් සකසා ගන්නා ලදී. ආහාර හා පෝෂණ ප්‍රකාශනය - 2 වෙළුම නො. 3. පිටු 41-50

14. රීති සංග්‍රහ අත්පොත - මව්කිරි ආදේශක අලෙවිකරණය පිළිබඳවූ, ජාත්‍යන්තර රීති සංග්‍රහය ක්‍රියාත්මක කිරීමේ අත්වැල

15. මව්කිරි සහ ළදරු පෝෂණය පිළිබඳ වූ "සාක් රීති සංග්‍රහය"

16. ළදරු කිරිපිටි ආදේශක, කිරි පොවන බෝතල් සහ ළදරු ආහාර පිළිබඳ වූ ඉන්දියානු පනත (නිෂ්පාදනය, සැපයීම සහ බෙදා හැරීම පිළිබඳ වූ විධිවිධානය) 1992

ඇමුණුම ඇ. I

විධාන අංක 44

1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත 6 (1) (ඇ) වගන්තිය යටතේ සාමාන්‍ය විධානය

ළදරු කිරි ආහාර, ළදරු ආහාර, ළදරු කිරි පොවන බෝතල් සහ කිරි පොවන බෝතල් සඳහා වූ රබර් සූප්පු වර්ග අලෙවිකරණය පිළිබඳ ශ්‍රී ලංකා රීති ප්‍රතිපත්ති සංග්‍රහය

1979.02.07 දින අංක 22/7, 1980.11.10 දින අංක 114/2 සහ 1981.09.16 දින අංක 158/5 යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රවල පිළිවෙලින් පළ කරන ලද අංක 44, 24 හා 31 යන විධානයන්ට අමතරව, අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ කොමසාරිස් ඩබ්ලි ක්‍රිස්ටෝපල්ස් රෙනී වික්‍රමසිංහ වන මම, 1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ 6 (ඇ) වගන්තිය යටතේ ක්‍රියා කරමින් සියළුම ළදරු කිරි ආහාර, ළදරු ආහාර, ළදරු කිරි පොවන බෝතල් සහ ළදරු කිරි පොවන බෝතල් සඳහා සූප්පු වර්ග නිෂ්පාදකයන් සහ වෙළෙන්දන් පහත දැක්වෙන "ළදරු කිරි ආහාර සහ ළදරු ආහාර, කිරි පොවන බෝතල් සහ කිරි පොවන බෝතල් සඳහා වූ රබර් සූප්පු වර්ග අලෙවි කිරීම සඳහා වූ රීති ප්‍රතිපත්ති සංග්‍රහය" පිළිපැදිය යුතු යැයි බව මෙයින් විධාන කරමි.

ඩී. සී. ආර්. වික්‍රමසිංහ
අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ කොමසාරිස්
අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව,

අංක 27
ගාලු මුවදොර ගොඩනැගිල්ල 2,
කොළඹ 3
1983 පෙබරවාරි මස 3 වන දිනදීය.



ඇමුණුම ඇ. II

විධාන අංක 107

1979 අංක 1 දරණ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත 6 (1) (ඇ) වගන්තිය යටතේ පොදු විධානය

අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ වැඩබලන කොමසාරිස් පියන්කර හේවා ජනක බන්දුල සුගතදාස වන මම, අර්ථ නිරූපන ආඥාපනතේ 18 වගන්තිය යටතේ ක්‍රියා කරමින් 1983 පෙබරවාරි මස 03 වෙනි දින අංක 231/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 44 දරන විධානය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කර 1980 අංක 37, 1992 අංක 34 සහ 1995 අංක 17 දරන පනත් වලින් සංශෝධනය වූ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ 6 (1) (ඇ) වගන්තිය යටතේ ක්‍රියාකරමින් සියළුම ළදරු කිරි ආහාර වර්ග නිෂ්පාදකයන් සහ වෙළෙන්දන් විසින් පහත දැක්වෙන "මව්කිරිදීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ අනුබල දීම සහ නම් කළ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ වන ශ්‍රී ලංකා රීති සංග්‍රහය" පිළිපැදිය යුතු යැයි මෙයින් විධානය කරමි.

පී. එච්. ජේ. බී. සුගතදාස
අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ වැඩබලන කොමසාරිස්

2003 මාර්තු මස 10 වැනි දින
අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව
අංක 27, ගාලු මුවදොර ගොඩනැගිල්ල 2
කොළඹ 3

පිටු අංක 7-31 දක්වා මෙම රීති සංග්‍රහය දැක්වේ

ඇමුණුම -෧

මාතෘ නිවාස, රෝහල්, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමය සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙත ළදරු කිරිපිටි සහ අනෙකුත් මව්කිරි ආදේශක, කිරි පොවන බෝතල් හෝ සූප්පු නොමිළයේ සහ අඩු මිලට බෙදා හැරීම අත්හිටුවීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ළදරු කිරිපිටි, මව්කිරි ආදේශක නිෂ්පාදකයන් හා බෙදා හරින්නන් සහ අනෙකුත් අදාල පාර්ශවයන් විසින් අත්සන් කරන ලද ගිවිසුම

1993 ජනවාරි මස 27 දින

කොළඹ, ශ්‍රී ලංකාව



මාතෘ නිවාසයනට, රෝහල් වලට, අනෙකුත් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයන් වලට සහ ඒවායේ කාර්ය මණ්ඩලය වෙත නොමිළයේ හෝ අඩු මිලට ළදරු කිරිපිටි, අනෙකුත් මව්කිරි ආදේශක, කිරි පොවන බෝතල් හෝ සූප්පු නොමිළයේ සහ අඩුමිලට බෙදා හැරීම අත්හිටුවීම පිළිබඳ ගිවිසුම

පහත අත්සන් කරන අයවලුන් මෙහි පහතින් දැක්වෙන පරිදි එකගව ක්‍රියාකිරීමට මෙයින් ගිවිස ගනිමු.

1. සෞඛ්‍ය අමාත්‍යාංශය මෙතැන් සිට, මාතෘ නිවාස, රෝහල්, අනෙකුත් සෞඛ්‍ය ආරක්සණ ක්‍රමය සහ සිය සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙත ළදරු කිරි පිටි සහ මව්කිරි ආදේශක නොමිළයේ සැපයීම හා බෙදා හැරීමේ කාර්යයන්හි නිරතවීම, ඒවා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම අත්හිටුවනු ඇත.

2. සෞඛ්‍ය අමාත්‍යාංශය සියළුම අදාල සෞඛ්‍ය පාරිපාලකයන්, සෞඛ්‍ය නිලධාරින්, සෞඛ්‍ය වෘත්තිකයින් සහ සෞඛ්‍ය සේවකයන් මෙම ගිවිසුම පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන් ඊට එකගව ක්‍රියාකිරීම සහතික කරනු වස්, මෙම ගිවිසුම සහ මව්කිරිදීම පිළිබඳ වූ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නියෝග නිකුත් කරනු ඇත.

3. මෙම ගිවිසුම අදාල වන සියළුම සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයන්හි මෙම ගිවිසුම ක්‍රියාත්මක වන අයුරු අධීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක වන අයුරු විමර්ශණය කිරීම සඳහා ක්‍රම විධින් ඇති කරනු ඇත. වාර්ෂිකව කරනු ලබන වාර්තා කිරීම් ද මෙම ක්‍රම විධින් වලට ඇතුලත් වනු ඇත. මෙම අධීක්ෂණ කමිටුවේ සභාපතිත්වය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් වරයා විසින් හොබවනු ලබන අතර එම කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත වනු ඇත. එනම්, ශ්‍රී ලංකාවේ දැනට කටයුතු කරනු ලබන ළදරු කිරිපිටි සමාගම් පහෙන් එක් සමාගමකින් එක් නියෝජිතයෙක් බැගින්ද, මහජන සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ගෙන්ද, ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ, පෝෂණ අංශයේ

අධ්‍යක්ෂගෙන්ද, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂගෙන්ද, ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමයෙහි නියෝජිතයකුගෙන්ද, ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ සංගමය, ශ්‍රී ලංකා ප්‍රසව සහ නාරිවේද සංගමය (College of Geneal Practitioners) ප්‍රජා වෛද්‍ය විද්‍යා සංගමය යන සංගම් වල එක් එක් නියෝජිතයෙකු බැගින් ද ලෝක සෞඛ්‍ය සංවිධානය සහ යුනිසෙප් ආයතනයේ නිරීක්ෂකයන්ගෙන්ද, වශයෙනි.

4. මාතෘ නිවාස, රෝහල්, අනෙකුත් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයන් සහ ඒවායෙහි සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට, මව්කිරි ආදේශක, කිරි පොවන බෝතල් සහ සූප්පු නොමිලයේ බෙදා හැරීම අත්හිටුවීමට අදාල නිෂ්පාදකයන්, බෙදා හරින්නන් සහ සැපයුම්කරුවන් එකඟවෙයි. තවද, ඔවුන් විසින් මෙකී දෑ තොග මිල ගණන් වලට වඩා අඩු මුදලට බෙදා නොහැරීමට කටයුතු කරමින්, එපරිද්දෙම කටයුතු කරන ලෙස අදාල සිය සේවකයන්ට දැන්වීමටත් මෙහිලා පොරොන්දු වෙයි.

5. ළදරු කිරිපිටි සහ මව්කිරි ආදේශක නිෂ්පාදකයන්, බෙදා හරින්නන් සහ සැපයුම්කරුවන්, මෙම ගිවිසුම හරියාකාරව ක්‍රියාත්මක වන බව මෙයින් සහතික කරනු වස් ඒ සඳහා අධීක්ෂණ වැඩ පිළිවෙලක් සම්පාදනය කරනු ඇත.

6. ශ්‍රී ලංකාවෙහි දැනට සහ ඉදිරියේදී මව්කිරි ආදේශක සහ ළදරු කිරිපිටි, කිරි පොවන බෝතල් සහ සූප්පු නිෂ්පාදනයෙහි හා අලෙවි කිරීමෙහි නිරත වන / නිරත වන්නා වූ ජාතික හෝ අන්තර් ජාතික සියළුම සමාගම් මගින් ඉහත දැක්වූ සියළුම පියවරයන් ක්‍රියාත්මක කිරීම තහවුරු කරනු වස් අදාල වන්නා වූ පියවරයන් ගනු ඇත. මෙම ගිවිසුමේ සඳහන් වගන්ති වලට අනුකූලව කටයුතු ක්‍රියාත්මක වන්නේද යන්න සොයා බැලීමට මව්කිරි ආදේශක සහ ළදරු කිරිපිටි නිෂ්පාදකයන්, බෙදාහරින්නන් සහ සැපයුම්කරුවන් ක්‍රියා කරනු ඇත.



7. ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශයේ පෝෂණ අංශය විසින් මෙම ගිවිසුමෙහි අන්තර් ගත වගන්ති ඇතුලත් වන සේ මව්කිරි ප්‍රවර්ධනය, මව්කිරි ආදේශක සහ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ ශ්‍රී ලංකා රීති පද්ධතිය සංශෝධනය කරනු ඇත. එමගින් ශ්‍රී ලංකාව විසින් 1981 සහ 1986 වර්ෂ වලදී පිළිගනු ලැබූ පරිදි මව්කිරි ආදේශක අලෙවිකරණය පිළිබඳව ජාත්‍යන්තර රීති පද්ධතිය සහ රට අදාළව ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ඉදිරිපත් කරන ලද සියළුම යෝජනාවන්හි අරමුණු සහ සිද්ධාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා බලතල පැවරෙනු ඇත.

ඉහත සඳහන් ගිවිසුමෙහි සාක්ෂි කරුවන් වශයෙන් පහත අත්සන් කරනු ලබන අයවලුන් විසින් මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් බලතල පවරනු ලැබේ.

| | |
|---|---|
| ජෝ ප්‍රනාන්දු | වෛද්‍ය ජෝ ප්‍රනාන්දු |
| .................................... | ලේකම් |
| සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය | සෞඛ්‍ය හා වනිතා කටයුතු |
| වෙනුවට | අමාත්‍යාංශය |
| | නම සහ තනතුර |
| ආර් එම්. කේ. රත්නායක | ආර්. එම්. කේ. රත්නායක |
| .................................... | අධ්‍යක්ෂ (පෝෂණ) |
| ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක | නම සහ තනතුර |
| කිරීමේ අමාත්‍යාංශය | |
| වෙනුවට | |
| එස්. ඩී. ආර්. අරුඩ්ප්‍රගාසම් | එස්. ඩී. ආර්. අරුඩ්ප්‍රගාසම් |
| සීමාසහිත ඩාර්ලි බට්ලර් සමාගම | කළමනාකරණ අධ්‍යක්ෂ |
| වෙනුවට | නම සහ තනතුර |
| පී. ගුණවර්ධන | පී. ගුණවර්ධන |
| .................................... | අලෙවිපරිපාලන කළමනාකරු |
| සීමාසහිත ලංකා මිල්ක් ෆුඩ්ස් (පෞද්) | නම සහ තනතුර |
| වෙනුවට | |

| | |
|---|---|
| ගැමුණු ජේසුන්දර | ගැමුණු විජේසුන්දර ඩී.ජේ. සී. එම්. ඒ |
| ...................................... | සමූහ ගණකාධිකාරී |
| සීමාසහිත ජේ. එල්. මොරිසන්ස් | නම සහ තනතුර |
| වෙනුවට | |

| | |
|---|---|
| කබ් විජේතුංග | කබ් විජේතුංග |
| ...................................... | අධ්‍යක්ෂ |
| සීමාසහිත නෙස්ලේ ලංකා | නම සහ තනතුර |
| වෙනුවට | |

| | |
|---|---|
| මොරිස් පී. වම්බැක් | මොරිස් පී. වම්බැක් |
| ...................................... | ශ්‍රී ලංකා කළමනාකරු |
| වයත් - අයර්ස්ට් | නම සහ තනතුර |
| වෙනුවට | |

| | |
|---|---|
| පී. එම්. ගින්තිලමේ | වෛද්‍ය පී. එම් ගින්තිලමේ |
| ...................................... | සභාපති-පොදු වෛද්‍ය |
| පොදු වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය | වෘත්තිකයන්ගේ විද්‍යාලය |
| වෙනුවට | නම සහ තනතුර |

| | |
|---|---|
| ලක්ෂ්මන් එල්. වීරසේන | වෛද්‍ය ලක්ෂ්මන් එල්. වීරසේන |
| ...................................... | සභාපති |
| නිදහස් වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය | නිදහස් වෛද්‍ය වෘත්තිකයන්ගේ |
| වෙනුවට | සංගමය |
| | නම සහ තනතුර |

| | |
|---|---|
| එච්. එම්. එස්. එස්. ඩී. හේරත් | වෛද්‍ය එච්.එම්. එස්. එස්. ඩී. හේරත් |
| ...................................... | උපසභාපති |
| ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය සංගමය | ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය සංගමය |
| වෙනුවට | |
| නම සහ තනතුර | |



| | |
|---|---|
| මර්ලින් අබේවර්ධන | වෛද්‍ය මර්ලින් අබේවර්ධන |
| ...................................... | භාණ්ඩාගාරික |
| ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේදීන්ගේ | ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේදීන්ගේ |
| විද්‍යාලය වෙනුවට | විද්‍යාලය |
| | නම සහ තනතුර |

| | |
|---|---|
| සනත් පී. ළමාබදුසූරිය | මහාචාර්ය සනත් පී. ළමාබදුසූරිය |
| ...................................... | සභාපති |
| ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයන්ගේ | ශ්‍රී ලංකා ළමා රෝග |
| සංගමය | විශේෂඥයන්ගේ සංගමය |
| වෙනුවට | නම සහ තනතුර |